# ශ්‍රී ලංකා මුස්ලිම් වරුන්ගේ අතීත පිය සටහන්

[ සිංහල – Sinhala – سنهالي ]

මුහම්මද් මන්සූර් දහ්ලාන්

2014 - 1435

IslamHouse.com

# تاريخ المسلمين في سريلانكا

« باللغة السنهالية »

محمد منصور دحلان

2014 - 1435

IslamHouse.com

# ශ්‍රී ලංකා මුස්ලිම් වරුන්ගේ අතීත පිය සටහන්-1

## (ලංකා යෝනකවරුන්ට ප්‍රෞඪ ඉතිහාසයක් තිබේ.)

සයිරස් ඩී. එෆ්. අබේකෝන් විසිනි.
(සිලෝන් ඔබ්සර්වර්, ඉරුදින සංග්‍රහය - 1949 ඔක්තෝබර් 23)

"අද දින ලංකා ඩොමීනියන් රාජ්‍යය පුරාම ලංකා යෝනක ජාතිකයෝ ඔවුන්ගේ ජාතික දිනය සමරති. මුල් පදිංචි කරුවන් අරාබියෙන් පැමිණි නමුදු සමස්ත ලංකා යෝනක සංගමය වෙනම අනන්‍යතාවකට සහ නාමයකට හිමිකම් කියති.

ලංකා යෝනකවරුන්ගේ මුලාරම්භය ශත වර්ෂ ගණනාවක් ඈතට විහිදේ. අබ්දල් මලික් බින් මර්වාන් කාලිෆ්වරයාගේ වධ හිංසා වලින් බේරීම සඳහා ඇතැම් අරාබි ජාතිකයෝ ලංකාවට (සෙරන්ඩිබ්) පැමිණ ත්‍රිකුණාමලය, යාපනය, මන්නාරම, පුත්තලම, කොළඹ, බේරුවල සහ ගාල්ල යන ප්‍රදේශ වල පදිංචි වූහ. සිංහල මිනිසුන් අතර ප්‍රසිද්ධව තිබුණේ මකල්ල වරාය වූ හෙයින් මේ අලුත් මිනිසුන් "මරක්කල" යන

නමින් ඔවුහු හැඳින් වූහ. ද්‍රවිඩයින් ඔවුන් හැඳින්වූයේ "චෝනහර්" යන නමිනි.

හිජ්රි වර්ෂ (හිජ්රි වර්ෂය ආරම්භ වන්නේ මුහම්මද් ධර්ම දූතයානන් ගේ උපන් බිම වූ මක්කාහ් ප්‍රදේශයේ ජීවත් වූ ඉස්ලාම් විරෝධී කුරෙෂ් ගෝත්‍රිකයින් එතුමාණන් ව මරා දැමීමට සූදානම් වීමත් සමග දෙවිඳුන්ගේ උපදෙස් පරිදි මදීනා නගරයට දේශාන්තරණය කළ දිනය පදනම් කරගෙනය. ඉස්ලාමීය දින දර්ශනයේ ආරම්භය මෙයත් සමග සිදු වේ. හිජ්රි යනු දේශාන්තරණය යන අරුත් ඇති අරාබි පදයකි. 402 දී අරාබියේ සිට තවත් පිරිසක් මෙහි පැමිණියහ. යෝනක මිනිසුන්ට ලංකාවේ රජුගෙන් හිරිහැරයක් නොවූ හෙයින් ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් බේරුවල වාස භූමිය කොට ගත්හ.

ඔවුන්ගේ ප්‍රගතියට කිසිවකුගෙන් හෝ බාධාවක් නොවීය. කොළඹ සිට හම්බන්තොට දක්වා වෙළඳාමේ ඔවුන් නිරත වූ අතර, සිංහල රජවරුන්ට ඔවුන් ගෙවූ බදු නිසා ක්‍රි. ව. 1350 වන විට ඔවුහු එක්තරා බලපෑමක් ඇති කළ හැකි පිරිසක් වූහ.

ඉතිහාසයට අනුව යෝනකවරුන්ගේ විශාලතම ආගමනය සිදු වූයේ පළමු වන බුවනෙකබාහු රාජ්‍ය කාලයේ අට වන වර්ෂයේදීය. අලුතින් පැමිණි මේ

අමුත්තන්ට පුත්තලමේ සිට බේරුවල දක්වා සමුද්‍ර තීරයේ ගම්මාන වල පදිංචි වීමට සහ සිංහල කුල කාන්තාවන් සමඟ විවාහ වීමට පළමු වන බුවනෙකබාහු රජු අවසර දුන්නේය. මුලින් ම ලංකාවට පැමිණි යෝනක ජාතිකයින්ගෙන් පැවතෙන්නන්ගේ සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් වැඩි වී ගියේය. ඔවුන් පසු කලෙකදී වුවද අරාබි ස්ත්‍රීන් මෙහි ගෙන්වා ගත් බවට වාර්තා නොමැත. සිංහල මව් පාර්ශවයෙන් පැවත එන්නන් ලෙසට ඔවුන්ට ඓතිහාසික පසුබිමක් ඇති බවට හිමිකම් කිව හැකිය.

ලංකාවේ යෝනක නායකයන්ට බොහෝ විට “හිමි” යන පටබැඳි නාමය තිබුණි. මීට හේතුව පුරාණ හිමියාර් හෝ යේමන අරාබි රාජධානිය සමග ඔවුන්ගේ තිබුණු සම්බන්ධතා විය හැකිය. මේ අනුව, වස්තු හිමි නමැති සිංහල යෝනක කුමරු කුරුණෑගල රාජධානිය කොට ගෙන දෙවන බුවනෙකබාහු නමින් ලංකාවේ රජ කළ බව පෙනේ.

## යෝනක රජු

වස්තු හිමි කුමාරයා වූ කලී පළමු වන බුවනෙකබාහු රජුගේ දෙවන බිසව වූ, කුරුණෑගල ට ආසන්න මැදකැටිය ගමේ විසූ කුලීන යෝනක කාන්තාවක් වූ යකඩ දෝලිය බිසවගේ පුත්‍රයා බව කුරුණෑගල පුරාවෘතයන්හි සඳහන් වේ. මේ කුමාරයා මුස්ලිම්

භක්තිකයෙකු වූ නමුත් පුණ්‍ය කටයුතු කිරීමෙන් පින් දහම් රැස් කිරීමට ආශා කළ රජෙකු බවත් බෞද්ධ භික්ෂූන් දහස් ගණනකට දිනපතා දානය පිරිනැමීමට ඔහු විසින් කටයුතු සැලසූ බවත් මහාවංශයේ සඳහන් වේ. "තමා ඔටුනු පලන් දින උත්සවය රජෙකුට ඔබින ඉතා අනර්ඝ තත්වයෙන් වර්ෂයක් පාසා ඔහු විසින් පවත්වන ලද අතර ඉන් පසු උපසම්පදා මංගල්‍යයක් ඉතා උත්සවශ්‍රීයෙන් පවත්වා බුදු දහමට ප්‍රධාන තැනක් ලබා දුන්නේය" යි මහාවංශය කියයි.

රාජකීය කුමාරිකාවකට (රන්දෝලිය බිසව) උපන් කුමරෙකුට, එනම්, වස්තු හිමි කුමාරයාගේ අර්ධ සොහොයුරෙකුට පක්ෂපාත වූ සිංහල අමාත්‍යවරුන් පිරිසක්, වස්තු හිමි කුමාරයාගේ රාජ්‍ය කාලයේ දෙවන වර්ෂයේදී, දැනට කුරුණෑගල කච්චේරිය පිහිටි ස්ථානයට පිටු පසින් පිහිටි ඇතුගල මුදුනේ පැවැත් වූ උත්සවයකට සහභාගී වන ලෙස රජුට ආරාධනා කොට ඔහු එකී ගල මුදුනෙන් පහළට පෙරළා ඔහුගේ මරණය සිදු කළහ. ඔහුගේ මරණය සිදු වූ ස්ථානයේ ගලේ බණ්ඩාර දේවාලය ඉදිකොට තිබේ. කුරුණෑගල විසූ එෆ්. එම්. මොඩර් මෙසේ ලියා තිබේ. "මේ අවාසනාවන්ත සිද්ධිය සිදු වූ ගල් පර්වතය අසල ප්‍රදේශයේ ඇතැම් දින වල මැදියම් රැයේදී දුඹුරු පැහැති අශ්වයෙකු පිට නැගී ගත් සුදු ඇඳ ගත් පුරුෂයෙකුගේ අවතාරය දිස්වන බව අද දක්වාම

මිනිස්සු විශ්වාස කරති. මේ වූ කලී වස්තු හිමි කුමරුගේ අවතාර යයි කියනු ලැබේ.

1470 - 71 දී හට ගත් සිංහල කැරැල්ලේදී දෙවන බුවනෙකබාහු රජුට විරුද්ධව නැගී සිටි කැරලි නායක සිරිවර්ධන පතිරාජට කුරුගම-හිමි නමැති බලසම්පන්න යෝනක ප්‍රධානියා විසින් උදව් කරන ලදී. කළු ගඟේ සිට වලවේ ගඟ දක්වා ද වැලිගම සිට කෝට්ටෙ අසල ප්‍රදේශය දක්වාද සිරිවර්ධනගේ හමුදා ප්‍රබලව සිටියහ. රජුගේ බාල සොහොයුරා විශාල හමුදාවක් රැගෙන වැලිගමට ගොස් කුරුගම-හිමිගේ පිටු පසින් පහර දුන් නමුත් අවසානයේදී සමගි සම්මුතියකට පැමිණ යුද්ධය සමාදාන වීමට රජුට සිදු විය. වැලිගම අද දක්වාත් වැදගත් යෝනක පිරිස වසන නගරයක්ව පවතී.

පෘතුගීසීන් විසින් ලංකාව සොයා ගන්නා ලද්දේ ද යෝනකවරුන් නිසාය. ලංකාවෙන් රැගෙන ගිය වටිනා කුළුබඩු රැගත් නැව් පසු පස පෘතුගීසීන් එළවා ගෙන යාමේදී කුණාටුවකට අසු වූ පෘතුගීසී නැව් ලංකාවේ වෙරළට ගසා ගෙන ආවේය. පසු කලෙක ලංකාව යටත් කොට එහි පාලනය ගැනීමට පෘතුගීසීන් පැමිණි විට ඔවුන්ට විරුද්ධව සටන් කිරීමට යෝනක ජාතිකයෝ දෙවන විජයබාහු රජුට සහයෝගය දුන්හ. කෝට්ටෙ රාජධානියට පිටතින් ආරක්ෂක පවුරක්

ඉදිකළ යෝනකයින් පෘතුගීසීන්ගේ ඉදිරි ගමන වැළැක් වීම සඳහා කාලතුවක්කු කීහිපයක් එහි සවි කළහ. පෘතුගීසීන්ට ජය අත් වූ පසු ඔවුන් හැකි තරම් විශාල වශයෙන් යෝනක ජාතිකයින් මරා දැමූහ. මේ ඝාතනයට අසු නොවී පලා ගිය සියලුම යෝනක වරුන් මහනුවර සෙනරත් බණ්ඩාර රජු විසින් පිළිගන්නා ලද අතර ඔවුනතුරින් ආරෝහ පරිනාහ අය මඩකලපුවේ යුද්ධ හමුදාවට බඳවා ගන්නා ලදී".

සයිරස් ඩී. එෆ්. අබේකෝන් විසිනි.
(සිලෝන් ඔබ්සර්වර්, ඉරුදින සංග්‍රහය - 1949 ඔක්තෝබර් 23)

## ඔටු බලකාය

හෙන්රි කොරයා.
(ද සන්ඩේ ඔබ්සර්වර්, ඉරුදින සංග්‍රහය - 1965 අගෝස්තු 8

"රණ ශුරයන් වූ ලංකා යෝනකවරු සිංහල යුද්ධ හමුදාවේ කොටසක් වූහ. ඔවුන්ගේ ඔටු බලකාය (ඔටු පැන්නිය) 17 වන ශත වර්ෂයේදී වැල්ලවාය සටනේදී ප්‍රමුඛ ස්ථානයක් ගත්තේය. වැල්ලවායේදී ලැබූ විශිෂ්ට ජයග්‍රහණය සිහි කිරීමක් වශයෙන් මේ ඔටු බලකායට ගෞරව කරමින් දෙවන රාජසිංහ රජු (ක්‍රි. වර්ෂ 1634

– 1684) විසින් හඟුරන්කෙත මහා දේවාලයට පූජා කරන ලද රාජකීය ප්‍රතිඥාත දේව අංගම් රෙද්දෙහි මේ බලකාය සිතුවම් කරන ලදී. මන්නාරමෙහි බෝබ් ගස් දෙකක් තවමත් තිබීම මෙහිලා සැලකිය යුතු කරුණකි. මේ ගස් වල කොළ ඔටුවන්ගේ ආහාරය පිණිස ගනු ලැබීය. මේ ගස් දෙකින් එකක් මන්නාරම් නගරය මැද ඇති අතර අනෙක පිහිටා ඇත්තේ මන්නාරමෙන් සැතපුම් දහයක් ඈත යාපනය පාරේ පපාමොටෙයි ගමෙහිය. මන්නාරම් දිස්ත්‍රික්කයේ මුරුක්කන් සහ සලවතුරෙයි (සිලාවතුර) හරහා යාමෙන් ළඟා විය හැකි අරිප්පු නමැති ස්ථානයේ මුහුදට මුහුණ ලා පිහිටි අත හැර දැමූ යෝනක ජල ස්ථම්භයක් දැනුදු දක්නට ඇත.

ලන්දේසි අද්මිරාල් ජෝරිස් වැන් ස්පිල්බර්ජන් මඩකලපුවට ගොඩ බට බව සැල වූ විට දෙවන විමලධර්මසූරිය රජු මහත් සේ සතුටට පත් ව මේ විශේෂ අමුත්තන් පිළිගැනීම සඳහා තුර්කි, යෝනක හා සිංහල වැනි නානා ජාතීන්ගෙන් සමන්විත බල ඇණි අටකින් සමන්විත වූ දහසක් පමණ යුද්ධ සේනාවක් මඩකලපුවට යැවූ බව වුටර් ස්කෝටන් විසින් ලියා තිබේ.

එක්තරා ලුණු ප්‍රමාණයක් වර්ෂයක් පාසා ලුණු බද්දේ දිසාවට ගෙනවුත් භාර දීමටත් පුවක් වෙළඳාමෙන්

ලැබෙන ලාභයෙන් කොටසක් භාණ්ඩාගාරයට ගෙවීමටත් යටත් ව මුහුදු බඩ පළාත් සමඟ වෙළඳාම් කිරීමේ තනි අයිතිය කන්ද උඩ රට රජ වරුන් විසින් යෝනක ජාතිකයන්ට දී තිබුණේය.

මුහුදු බඩ ප්‍රදේශ වල සංචාරය කිරීමේදී යෝනක වෙළඳුන්ට දී තිබුණු අවසර පත් ඒ ඒ කඩවත් භාරව සිටි මුදලි වරුන්ට පෙන්වීමට යෝනක වෙළඳුන්ට නියම කර තිබුණු බවත් ලේඛනාගාර වල ඇති ඕලන්ද ලේඛන වලින් පෙනේ.

කල්පිටිය සහ පුත්තලම වරාය වලට ඇතුළු වන උඩරට යෝනක වෙළඳුන් විසින් රතු සිංහ රූපයක් සහිත සුදු කොඩියක්, වෙළඳ බඩු වැඩි වැඩියෙන්ම පුරවා තිබුන සෑම යාත්‍රාවකම ඔසවා තැබීම විශේෂ සිද්ධියකි.

මේ අනුව බලන කළ, ඔවුන්ගෙන් පැවතෙන්නන් වූ වර්තමාන යෝනකවරු සිංහ කොඩියට සැලකිලි දැක්වීම පුදුමයට කාරණයක් නොවේ. ඔවුන් ලංකාවට ගොඩ බට දිනයේ සිටම සිංහ කොඩිය ඔවුන්ගේ ඉතිහාසයේ කොටසක්ව පවතී.

නිශ්චල කලපු ජලයෙන් යුත් ලේවායන් හරහා සැතපුම් හතරක් ඇතින් නැතහොත් පුත්තලමේ සිට

බටහිර දෙසට විහිදී කල්පිටියට යන ධූලි සහිත පාරේ සැතපුම් දහයක් ගිය තැන නවකඩ්ඩු නමැති අප්‍රකට ගම්මානය පිහිටා තිබේ. මෙහි පිහිටි අලංකාර පුළුල් වෙරළේ බොරලු රහිත සිහින් වැලිතලාව මෘදු පාද වලට සුව පහසුව ගෙන දෙන්නකි. රළ පතරින් තොර මුහුද කොතරම් නොගැඹුරු ද යත්, බොහෝ ඈතට යන තෙක් ළදරුවන්ට වුවද එහි බැස යා හැකිය.

මේ ගම නවකඩ්ඩු යනුවෙන් නම් කර ඇත්තේ කඩු නවයක ගම යන අර්ථයෙනි. එකල රජතුමෙකු ගේ අභිෂේක මංගල්‍යයෙන් පසු අභිනව රජතුමා මුහුදේ ස්නානය කොට රාජකීය අසිපත පැලදීමට පෙර එය මුහුදු ජලයේ එබිය යුතුව තිබිණි. ඔහු ලංකාවේ රජු වශයෙන් හඳුන්වනු ලබන්නේ මේ චාරිත්‍රය ඉටු කිරීමෙන් පසුව පමණකි. මෙකී පෞරාණික චාරිත්‍රය ඉටු කිරීම සඳහා රජවරුන් නව දෙනෙකු තම අසිපත් මෙම ගම අවට මුහුදු ජලයේ ඔබා ඇති බැවින් ගමට මේ නම ලැබුණේ යැයි කියනු ලැබේ.

මෞලි මංගල්‍යයේ මේ චාරිත්‍රය, මහනුවර දළදා මාලිගාවේ සහ දේවාල වල පෙරහැර අවසාන වීමෙන් පසු සිදු කරනු ලබන  දිය කැපීමේ උත්සවයට සම්බන්ධ වුවක් දැයි අපි නොදනිමු. එහෙත් මෙම චාරිත්‍ර දෙකෙහි කැපී පෙනෙන සමානත්වයක් දක්නට තිබේ.

ඇතැම් විට, රජතුමෙකු තමන්ගේ රාජධානියට අයත් සමුද්‍රයට ද අධිපතියා බව හැඟවීම සඳහාත් තම කඩුවේ බලයෙන් සමුද්‍රය ආරක්ෂා කිරීමට ප්‍රතිඥා දීමක් වශයෙනුත් මේ චාරිත්‍රය පවත්වනවා විය හැකිය. විජය කුමාරයා මේ ගම අසල ප්‍රදේශයකට ගොඩ බැස්ස නිසාත් පුත්තලමෙන් සැතපුම් හයක් පමණ ඈත පිහිටි තම්මැන්නාල විල නමැති ස්ථානයේදී කුවේණී සමග ඔහුගේ විවාහය සිදු කරනු ලැබූ හෙයින් ඒ නගරය මගුල් තොටමුණ යන නමින් ප්‍රකට වීම නිසාත් මේ චාරිත්‍රය ඇති වූයේ යැයිද සිතිය හැකිය.

## අරාබි වෙළෙන්දෝ

පුත්තලමේ පදිංචි කරුවන්ගෙන් වැඩි දෙනා යෝනක ජාතිකයෝ වෙති. මෙම යෝනක ජාතිකයෝ වූ කලී, ලුණු හිඳීමට හා වෙළඳාම් කිරීමට අමතරව මුතු කිමිදීම, පොල් වගා කිරීම සහ වී ගොවිතැන් කිරීම සඳහා අට වන සිය වසේදී මෙහි පැමිණි අරාබි ජාතිකයන්ගෙන් පැවතෙන්නෝ වෙති. මේ නිසාම මෙමම නගරයේ ඇති මුස්ලිම් දේවස්ථානය අත්‍යලංකාර විශිෂ්ට ගොඩනැගිල්ලක් ලෙස ඉදි කොට තිබේ. මේ දේවස්ථානයේ උත්තුංග කොත් ඉතා ඈතට දර්ශනය වන අතර ළඟ සිට නරඹන්නෙකුට මේ දේවස්ථානයේ අලංකාරය සහ

එය තබා ඇති මනහර තත්වය මැනවින් දැකිය හැකිය. එහෙත් මේ සැමටත් වඩා මේ දේවස්ථානයේ ඇති විශේෂ ලක්ෂණය නම් සිංහල රජ දරුවෙකු විසින් තම කෘතඥතාව පළ කිරීම වස් තමාගේ රාජ පාක්ෂික යෝනක ජාතිකයින්ට තෑගී කරන ලද අගනා තෑගී රැසක් මෙහි තබා තිබීමය.

සිංහල රාජ පරම්පරාවේ අවසාන රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා චාරිත්‍රානුකූලව මෞලි මංගල්‍යය අවසාන කිරීමට නවකඩ්ඩු බලා යන ගමනේදී මේ නගරයෙන් පිටත පිහිටි සෙල්ලංකෙන්ඩල් නමැති ස්ථානයෙහි නතර වී ඇත. මේ ස්ථානය අද විනෝද කාමීන්ගේ ජනප්‍රිය ස්ථානයකි. විශේෂයෙන්ම, උෂ්ණාධික දින වල දූවිල්ලෙන් පිරි මාර්ග වල ගමන් කොට විඩා පත් මිනිසුන්ට මෙහි ඇති පිරිසිදු වැලිතලාව සහ පැහැදිලි ජලය ආනන්ද ජනකය. ඉහත සඳහන් පරිදි නරේන්ද්‍රසිංහ රජතුමා මෙහි සැපත් වූ අවස්ථාවේදී මේ ප්‍රදේශය පාලනය කරන ලද්දේ හෙට්ටි ගෝත්‍රයට අයත් රාමනාදන් නමැති දිසාව විසිනි. මුරමඩ්ඩු නමැති ඔහුගේ දිසා සභය මුක්කුමාර් ජන ප්‍රධානීන් අට දෙනෙකුගෙන් සමන්විත වූවකි. ඔවුන් රජු සඳහා තාවකාලික මණ්ඩපයක් ඉදි කොට ඒ ප්‍රදේශයෙන් ලබා ගත හැකි වූ සෑම වර්ගයකම ප්‍රණීත ආහාර පාන වලින් රජතුමාට සංග්‍රහ කරන ලදී. එහෙත් රජුට හෝ රජතුමාගේ පිරිසේ අන් කිසිවෙකුට

හෝ කවරදාක වත් සතුරු උවදුරක් මෙහිදී පැමිණේ යැයි ඔවුහු සිහිනෙන් පවා නොසිතූහ.

## මිනීමරුවන් පලවා හැරීම

බලෙන් රජකම උදුරා ගැනීමට අපේක්ෂා කළ තැනැත්තෙකු විසින් රජු මරා දැමීමට එවන ලද පිරිසකගේ කඩා වැදීම නිසා හදිසේයේම විශාල කලබැගෑනියක් ඇති විය. මේ අවස්ථාවේදී රජුට හරසර දැක්වීමට පැමිණ සිටි යෝනක ජනයා විසින් මිනීමරුවන්ට පහර දී තළා පෙළා ඔවුන් පලවා හරින ලදී.

කෘතඥ පූර්වක රජතුමා මේ යෝනක ජනයාගේ නිර්භීත භාවය සහ රාජ පාක්ෂික භාවය ගැන පැහැදී මහනුවර රාජ ලාංඡනය සහිත තමාගේ පෞද්ගලික කොඩියද රාජකීය පෙරහැරේ භාවිත කළ සංගීත භාණ්ඩ කිහිපයක්ද චාමර දෙකක්ද රිදී ටැසල් දහ අටක් සහ වෙනත් බොහෝ භාණ්ඩද ඔවුන්ට තෑගි කොට ඒවා ඔවුන්ගේ පෙරහැරයන්හි පාවිච්චි කිරීමට උපදෙස් දුන්හ.

රජතුමා තෑගී කළ ඉහත සඳහන් කොඩියට කුමක් වුයේ දැයි දැන ගන්නට නැති නමුත් අනෙකුත් සියලුම භාණ්ඩ සුරක්ෂිතව යට කී දේව ස්ථානයෙහි තබා තිබේ. එසේම, රජතුමා අපේක්ෂා කළ පරිද්දෙන් මේ

භාණ්ඩ සමහරක් පෙරහැර වලදී භාවිත කරනු ලැබේ. එසේ තෑගී කරන ලද හොරණෑ වලින් එකක් කොට කිරීමට සිදු විය. එය තිබුණු පරිදි පිඹීමට අපහසුවූ අතර ශත වර්ෂ ගණනකට ඉහත දී සිටි මිනිසුන්ට අදට වඩා ශක්තිමත් පෙණහලු තිබුණේදැයි ඒ දකින ඇතැමෙකුට සිතෙන්නට පුළුවන."

හෙන්රි කොරයා.

(ද සන්ඩේ ඔබ්සර්වර්, ඉරුදින සංග්‍රහය - 1965 අගෝස්තු 8)

(උපුටා ගැනීම: "ශ්‍රී ලංකා යෝනකවරුන්ගේ අතීත පියසටහන්" - යෝනක ඉස්ලාමීය සංස්කෘතික නිකේතනය - කොළඹ)

# ශ්‍රී ලංකා මුස්ලිම් වරුන්ගේ අතීත පිය සටහන්-2.

අරාබි පිය පාර්ශවයෙන් හා සිංහල මව් පාර්ශවයෙන් පැවත එන ශ්‍රී ලාංකේය මුස්ලිම් වරුන්ගේ මව්බස දෙමළ වූයේ කෙසේද යන්න පිළිබඳ මහාචාර්ය ලෝර්නා දේවරාජ මහත්මිය විසින් සකස් කරන ලද “ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු – සහශ්‍රයක ජනවාර්ගික සහජීවනය, 900-1915” නම් වූ පර්යේෂණාත්මක ග්‍රන්ථයෙන් උපුටා ගත් කොටසක් පහතින් ඉදිරිපත් කොට ඇත්තෙමු.

“ශ්‍රී ලංකාවේ මුස්ලිම් වරුන්ගේ මව්බස කුමක්ද යනු මත භේදයට තුඩුදුන් කරුණකි. උතුරේ සහ නැගෙනහිර අය දෙමළ භාෂාව කථා කරන අතර දිවයිනේ අනෙකුත් ප්‍රදේශ වල භාෂා දෙකම කථා කරති. මැදපෙරදිගින් මුලින්ම පැමිණි සාංක්‍රමණිකයෝ අල් කුර්ආනයේ භාෂාව හා ආගමික මෙහෙය පවත් වන අරාබි භාෂාව කථා කළහ. එනිසා බෞද්ධයන්ට පාලි භාෂාව මෙන් මුස්ලිම් වරුන්ට අරාබි භාෂාව ශුද්ධ වන්ත එකක් වී තිබේ. එසේ වුවද ඉන්දියන් සාගරයේ වෙරළබඩ වාණිජ කටයුතු වලදී දෙමළ භාෂාව බහුල ලෙස භාවිත කරනු ලැබූ බැවින්

එය කතා කිරීම මුස්ලිම් වෙළන්දන් හට ප්‍රායෝගික අවශ්‍යතාවක් විය.

මුස්ලිම් සංක්‍රමණිකයන්ගෙන් දෙවන පිරිස ශ්‍රී ලංකාවට අවතීර්ණ වූයේ දකුණු ඉන්දියාවෙනි. දකුණු ඉන්දියානු වරාය වල පදිංචි ව සිටි මුල් අරාබි වෙළන්දෝ දේශීය ස්ත්‍රීන් විවාහ කර ගත්හ. මේ කුඩා මුස්ලිම් ප්‍රජාව, හින්දු ආගම අත හැර ඉස්ලාම් ආගම වැලඳ ගත් සැලකිය යුතු ප්‍රමාණයක් වූ නිසා සංඛ්‍යාත්මක වශයෙන් වර්ධනය විය. දකුණු ඉන්දියාවේ මුස්ලිම් ජනගහනය වර්ධනය වෙත්ම, ද්‍රවිඩ වාග් ස්වර විද්‍යාව උල්ලංඝනය නොවන පරිදි යම් යම් වෙනස් කම් සහිතව දෙමළ සහ මලයාලම් භාෂා අරාබි අක්ෂරයෙන් ලිවීමට පටන් ගත්හ. ඉස්ලාමීය සංකල්ප සහ ආගමෙන් මුළුමනින්ම වෙන් කළ නොහැකි යම් යම් කටයුතු ප්‍රකාශ කිරීම සඳහා අරාබි වචන ගණනාවක් හඳුන්වා දී තිබේ. මෙම උපභාෂාව අරාබි-දෙමළ භාෂාව යනුවෙන් හැඳින්විණි. දකුණු ඉන්දියාවේ මුස්ලිම් වරුන් ඉස්ලාමීය ලෝකයේ සාහිත්‍යය දැන සිටි අතර ඒවායින් සමහරක් අරාබි-දෙමළ භාෂාවට පරිවර්තනය කරනු ලැබීය. දහ හතර වන සියවසේ සිට අරාබි දෙමළ මාධ්‍යයෙන් දකුණු ඉන්දියාවෙන් ඉස්ලාම්හි බලපෑම් පැතිරෙන්නට විය.

දකුණු ඉන්දියාවේ මුස්ලිම් වරුන් සහ ශ්‍රී ලංකාව අතර පැවති වාණිජ සම්බන්ධකම් සහ සංස්කෘතික සම්බන්ධතා අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් විය. ඉස්ලාම් දහම හැදෑරීම සඳහා වෙල්ලෝරයේ දේව ධර්ම ආයතන වලට ගිය ශ්‍රී ලාංකික මුස්ලිම් පරම්පරා ආපසු පැමිණ තමන් උගත් දේ අන් අයට පහදා දුන්හ. වර්ධනය වූ මිත්‍ර සම්බන්ධකම් කෙතරම් වීද යත්, දකුණු ඉන්දියානු මුස්ලිම් වරුන් ගරු බුහුමන් දැක් වූ පුද්ගලයෝ ශ්‍රී ලාංකික මුස්ලිම් වරුන් අතරද ඒ හා සමාන ගෞරවයකට පාත්‍ර වූහ. සතකතුල්ලා අප්පා, මාප්පිල්ලේ ලෙබ්බේ අලීම් වැනි නම් පෝක් සමුද්‍ර සංධිය දෙපැත්තේම එක ලෙස ප්‍රචලිත විය. මේ සියලු සම්බන්ධතා පවත්වනු ලැබුයේ අරාබි දෙමළ භාෂාව මගිනි. එය මුස්ලිම් වරුන්ගේ වාණිජ භාෂාව පමණක් නොව ඉස්ලාමීය සංස්කෘතියේ භාෂාවද විය. අල් කුර්ආනය අරාබි-දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලද අතර මෑතක් වන තුරුම එය සිංහලයට පරිවර්තනය කරනු නොලැබීය. මුස්ලිම් ළමයින් අනිවාර්යයෙන්ම අල් කුර්ආනය කියවිය යුතු වූ බැවින් ඔවුන්ට අරාබි-දෙමළ භාෂාව ඉගෙන ගැනීමට සිදු විය. මුළුමනින්ම සිංහල කතා කරන ප්‍රදේශ වල ශත වර්ෂ ගණනාවක් ජීවත් වූ මුස්ලිම් වරුන් ඔවුන්ගේ මව් බස වශයෙන් අරාබි-දෙමළ භාෂාව රැකගත්තේ මන්දැයි මෙයින් පැහැදිලි වේ.” (“ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු – සහශ්‍රයක ජනවාර්ගික සහජීවනය, 900-1915” ග්‍රන්ථ

කර්තෘ: ඉතිහාසය පිළිබඳ මහාචාර්ය ලෝනා දේවරාජ මහත්මිය)

අද ඇතැම් ආගම්භේදවාදීන්ගේ මතය වී තිබෙන්නේ ලාංකේය මුස්ලිම් වරුන් මෙරටට අයිති නැති බවත් ඔවුන් ඔවුන්ගේ මුල් ප්‍රදේශ වන අරාබියට නැවත යා යුතු බවත්ය. මේ නිසා අපට වත්මන් ශ්‍රී ලාංකේය මුස්ලිම් වරුන් ලංකාවට සම්බන්ධ වූයේ කෙසේද? යන්න පිළිබඳව මඳක් සොයන්නට සිතුණි. එම නිසා පහත සඳහන් මූලාශ්‍රයන් මගින් උපුටා ගත් කොටස් සැමගේ අවධානය පිණිස මෙමගින් ඉදිරිපත් කරන්නෙමු.

“අප කවුරුත් දන්නා පරිදි ශ්‍රී ලංකාවේ මුස්ලිම් වරුන්ගේ ආරම්භය පිළිබඳව මූලික ප්‍රභවයන් රැසක් දායක වී ඇත. ඒවා නම් ලංකාවට පැමිණි අරාබි වෙළඳුන්, මලබාර වෙළඳුන් සහ ජාවකයන්ය. මෙයින් අරාබි වෙළඳුන් සමග ශ්‍රී ලංකාවෙහි තිබුණු සබඳතාව පූර්ව ඉස්ලාමීය යුගය දක්වා ඈතට විහිදී ඇත. ලංකාවේ රජ කළ පණ්ඩුකාභය රජතුමාගේ කාලයේ ඉතිහාසය ගවේෂණය කරන අපට ඒ ගැන සාධකයක් හමු වෙයි. එනම් පණ්ඩුකාභය රජු (ක්‍රි.පූ. 377-307) තම අගනුවර වූ අනුරාධපුරයෙහි යම් යම් ඉඩම්, අගනුවරට පැමිණි පූර්ව ඉස්ලාමීය යුගයේ අරාබි වෙළඳුන් වූ යෝනකයන් (මහාවංශය, X, පි.90) සඳහා

වෙන් කළ බවයි. තවද අනුරාධපුර යුගයේ අගනුවර තුළ යවන (යොනුන් වාසය කළ) වීදි පවා තිබුණු බව ඉතිහාසයේ සඳහන් වේ.

ඉතිහාසය මේ කියන දෙය සත්‍යයක් නම් ශ්‍රී ලංකාවට පැමිණි විජය කුමාරයා සහ පිරිස මෙරටට ආ යුගයට පෙර හෝ ඊට පසු කාලයේ සිට අරාබි වරුන් මෙරටට පැමිණ මෙරට සමග ගනු දෙනු කරන්නට ඇත.

එමෙන්ම ලංකාවට පැමිණි අරාබි ජාතිකයන් දේශීය කාන්තාවන් සමග විවාහ වීම නිසා අරාබි සිංහල මිශ්‍ර දේහ ලක්ෂණ වලින් හෙබි සමාජයක් බිහි වන්නට ඇත. මෙම යෝනක සමාජයේ සිටි ඇතැම් ස්ත්‍රීන් සිංහල රජ වරුන්ගේ ආකර්ෂණයට පාත්‍ර වුවා පමණක් නොව ඇතැම් සංදේශ කාව්‍යයන් කළ කවීන්ගේ වර්ණනාවට පවා පාත්‍ර විය. පහළොස් වන ශත වර්ෂයේ සාහිත්‍ය කෘති වූ සංදේශ කාව්‍ය වල (කෝකිල සංදේශ වර්ණනාව, ඩබ්.එෆ්. ගුණවර්ධන, 74 වන කවිය සහ ගිරා සංදේශ විවරණය, මුණිදාස කුමාරතුංග, 104 වන කවිය) යොන් ලියන් හෙවත් මෙමම අරාබි මිශ්‍ර යෝනක කාන්තාවන් ගැන සඳහන් වේ. මේ නිසා අරාබි වරුන් මෙරට සමග ගනු දෙනු කළේ මෑතක සිට නොවන බව සහ ඔවුන් විසින් මෙරට ජනාවාස කර ගත්තේද අද ඊයෙක නොවන බව ද පැහැදිලිය.

ශ්‍රී ලංකාවේ මුස්ලිම් වරුන්ගේ මුතුන් මිත්තන් නව වන ශත වර්ෂයේ දී කායල්පට්නම් හි මුල් ජනාවාස පිහිටුවා ගත් අතර ඉන් අවුරුදු ගණනාවකට පසුව 1024 දී එම නගරයෙන් පැමිණි පිරිසක් බේරුවල ජනාවාසයක් පිහිටුවා ගත්තේය, යන මතය කාසිචෙට්ටි විසින් සඳහන් කරන ලදී. (Casie Chetty, The Ceylon Gazeteer)

තමා සිටි කාලයේ බේරුවල පදිංචි වී සිටි ඉතාම පැරණි මුස්ලිම් පවුල් වලින් එකක් සතුව පැවති පුරාණ අරාබි ලේඛනයක්, 1926 දී ලියන ලද "සෝනහාර්" නම් වූ සිය කෘතියෙහි ජේ.සී. වැන් සැන්ඩන් උපුටා දක්වයි. එහි දැක්වෙන පරිදි, යේමනයෙහ් රජ පවුලකට අයත් පුතුන් දෙදෙනෙකු ක්‍රි.ව 604 දී ලංකාවට පැමිණ ඇත. ඉන් එක් තැනැත්තෙක් මන්නාරමට ගොඩ බැස අතර අනෙක් තැනැත්තා බේරුවල ගොඩ බැස එහි පදිංචි වී ඇත. ඔහුගෙන් පැවතෙන්නන් බැව් කියා පෑ මුස්ලිම්වරු කිහිප දෙනෙක්ම බේරුවල සිටියහ. (J.C Van Sanden Sonahar, A Brief History of the Moors of Ceylon, Colombo, 1926,pp.117-118)

කෙසේ වුවද මගේ අදහස නම් ලොව නා නා විධ ස්ථාන වලින් මෙරටට ගොඩ බැසි මුස්ලිම් වෙළඳුන්

ලක්දිව කාන්තාවන් සමග විවාහ වී මෙරට මුල් බසින්නට ඇත. එලෙස මෙරට මුල් බැසි ඔවුන් විවිධ වූ ජනවර්ග වලට අයත් අයවලුන් වුවද සිය දහම ලෙස ඉස්ලාම් බැතිමතුන් වුයෙන් මුස්ලිම් ලෙස හැඳින්වෙන්නට ඇත. මේ අය දහමේ නාමයෙන් එක්ව පසුව මුස්ලිම් නමින් ජනවර්ගයක් ලෙස බිහි ව ඇති බවයි.

වත්මන් සමාජයට අතීතය දෙස බැලීමෙන් ඉතිහාසයෙන් ලද හැකි ආදර්ශයන් බොහෝය. විශේෂයෙන් අතීතයේ අප රට තුළ තිබුණු ආගමික සහජීවනය අරහයා ලද හැකි පාඩම් බොහෝමයක් ඇත. විශේෂයෙන් උඩරට පාලන කාලය තුළ සහ ඊට පසුව මුස්ලිම් වරුන් සහ උඩරට සමාජය අතර තිබුණු සහසම්බන්ධය ඉතා විශිෂ්ටය.” (මහාචාර්ය ලෝනා දේවරාජගේ “ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු – සහශ්‍රයක ජනවාර්ගික සහජීවනය” නම් වූ කෘතියේ 146 වැනි පිටුවෙන් පහත කොටස උපුටා ගන්නා ලදී.

“1872 දී සම්පාදනය කරනු ලැබූ, මහනුවර දිස්ත්‍රික්කයට අයත් රාජකාරි බදු ලේඛනයේ (Service Tenures Register, Kandy, Vols. 1,2, 1872 කච්චේරියෙන් හමු වූ අත් පිටපත) කරන ලද සේවාවන් වෙනුවෙන් මාලිගාවට අයත් සේවා පංගු

වල පදිංචි ව සිටි මුස්ලිම් වරුන් කිහිප දෙනෙකුගේ නම් සඳහන් වේ. මුස්ලිම් වරුන් ඉටු කරන ලද සේවාවන්, හීන කුලයේ කාර්යයක් යැයි සලකනු ලැබූ බෙර ගැසීමේ සිට ගොවි කුලයේ උසස් අය විසින් පමණක් උසුලන ලද ඉතා සම්භාවනීය ස්වභාවයේ නිලයන් දක්වා පැතිරුණු ඒවා විය.

මොහොමඩ් ලෙබ්බේ සහ උදුමා ලෙබ්බේ යන මුස්ලිම් වරුන් දෙදෙනා දළදා මාලිගාවට අයත් පල්ලෙ ගම්පහ කහවත්ත නම් ගමේ ලුණු දෙන පංගුව භුක්ති වින්දාහ. එම පංගුවට අයත් රාජකාරිය වූයේ, අලුත් අවුරුදු මංගල්‍යය සඳහා හොඳ පිරිසිදු ලුණු සේරු 20ක් මාලිගාවට සැපයීමයි. (STR of the Dalada Maligava, Services due from Harispattuva p.695) උඩරට රාජධානියේ අන්තිම කාලය වන විට ඕලන්ද වරුන් වරායවල් පාලනය කරමින් අත්‍යවශ්‍ය වෙළඳාම සීමා කිරීමට උත්සාහ දරමින් සිටි බැවි සිහිපත් කිරීමේදී මෙම රාජකාරියේ බැරෑරුම් කම වැටහෙනු ඇත. මාලිගාවේ කාර්ය මණ්ඩලයට ආහාර පාන සැපයීම සඳහා ප්‍රමාණවත් ලුණු සහ කරවල තොග තබා ගැනීමට මාලිගාවේ මුලාදෑනීන්ට සිදු විය. දියවඩන නිලමෙට කරවල කූරියකු සහ බුලත් හුරුල්ලක් (කොළ හතළිහක්) සැපයීමද ඒ රාජකාරියේම කොටසක් විය.

බුලත් හුරුල්ලක් පිළිගැන්වීම යමකුගේ හාම්පුතුන් හට ගරුසරු දැක්වීමේ චාරිත්‍රයකි. මේ සිරිත දැනුදු, විශේෂයෙන්ම සිංහල අලුත් අවුරුදු සමයේදී ශ්‍රී ලංකාවේදී සිදු කෙරෙනු දැකිය හැකිය.

ලුණු සහ කරවල සැපයීම, මුස්ලිම් වරුන් විසින් ඉටු කරන ලද ආගමික හෝ සංස්කෘතික හෝ වැදගත්කමකින් තොර හුදෙක්ම ප්‍රයෝජනය මූලික කර ගත් රාජකාරියක් වශයෙන් සැලකිය හැකිය. කෙසේ වුවද, මාලිගාවට අයත් ගම් වල හේවිසි පංගුව භුක්ති විඳි මුස්ලිම් වරුන් සෑහෙන සංඛ්‍යාවක් සිටිය බව සැලකිල්ල යොමු විය යුතු කරුණකි.”

මෙම කොටස උපුටා ගන්නා ලද්දේ කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ සම මහාචාර්යවරියව සිටි මහාචාර්ය ලෝනා දේවරාජ මහත්මිය විසින් රචිත, ලංකා ඉස්ලාමීය පදනම විසින් ප්‍රකාශයට පත්කරන ලද, “ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු – සහශ්‍රයක ජනවාර්ගික සහජීවනය, 900-1915” නම් වූ කෘතියේ 146 වැනි පිටුවෙනි.

# ශ්‍රී ලංකා මුස්ලිම් වරුන්ගේ අතීත පිය සටහන්-3.

"ලංකාදීප" 2012 මැයි 5 වෙනිදා සෙනසුරාදා. සුජිත් අක්කරවත්ත

## රහමාන් යාපනයට පා තබයි

"කෝට්ටෙ රාජධානිය තුන් කඩකට බෙදී යාමේ සිදුවීම් විජයබා කොල්ලය ලෙස සුප්‍රකටය. මෙලෙස සිංහල රාජධානිය සී සී කඩව බෙදී යාම පෘතුගීසීන් අමන්දානන්දයට පත් කළ සිදුවීම විය. පස්වනක් ප්‍රීතියෙන් පෘතුගීසීන් ඔකඳ කළ කෝට්ටෙ බෙදීයාම තවත් ආඩම්බරකාර සිදුවීමක් වුයේ නව වන බුවනෙකබාහු ගේ මුස්ලිම් විරෝධය නිසාය. අරාබි මුහුදේ වෙළෙඳ බලය සඳහා පෘතුගීසීන් සහ මුස්ලිම්වරුන් අතර යුද ඇවිළී තිබූ මෙකල එම වෛරය සිරිලකදී ද පුපුරා යමින් තිබිණි. විශේෂයෙන්ම කොළඹ කොටුව වටා පැතිර සිටි මුස්ලිම් සහ අරාබි වෙළෙඳ ප්‍රජාවගේ දැඩි විරෝධතාවන්ට පෘතුගීසීන්ට මුහුණ දෙන්නට සිදු විය. මෙය කෝට්ටෙ අග නගරයේදී ද එලෙසම විය. එම නිසා පෘතුගීසීන් මාන බලමින් සිටියේ කෝට්ටෙ අගනගරයෙන් මුස්ලිම්වරුන් පන්නා දැමීමටය. පුත්‍රයෙකු නොමැතිව හා තම සහෝදර

මායාදුන්නේගේ නැගී ඒම ද නිසා මහත් බියෙන් රජ පදවි දරමින් සිටි නව වන බුවනෙකබාහුගේ භීතිය තෙගුණ වූයේ පෘතුගීසීන් හදිසියේ කළ බලපෑම නිසාය.

ඒ අනුව පෘතුගීසීහු කෝට්ටේ රැක දීමට නම් නව වන බුවනෙකබාහු කිතුනුවෙකු විය යුතු බව දන්වා සිටියහ. රජු එයට මැළි වූ කළ පෘතුගීසීහු අග නගරයට කඩා වැදී නගරය ගිනිබත් කළහ. එදින රාත්‍රියේ කෝට්ටේ දළදා මැදුරෙහි වැඩ සිටි දන්ත ධාතුන් වහන්සේ හිරිපිටියේ දිවනරාළ විසින් සීතාවකට ගෙන යනු ලැබූහ. මේ අතර පෘතුගීසීහු මුණගැසුණු රජ තෙමේ වෙනත් එකඟතාවක් සඳහා සාකච්ඡා ආරම්භ කළේය. තමාට බෞද්ධත්වය අත් හැර දැමිය නොහැකි බවත් වෙනත් ඕනෑම ඉල්ලීමකට එකඟ වන බවත් රජු පෘතුගීසීන්ට කීවේය.

ඒ අනුව පෘතුගීසීහු ඉල්ලීම් දෙකක් රජුට ඉදිරිපත් කළහ. ඔවුන්ගේ පළමු ඉල්ලීම වූයේ රජුගේ මුනුබුරා ඔටුන්න හිමි කුමරු ලෙස නම් කර ඔහු කිතුනු ආගමට හරවන ලෙසය. දෙවන ඉල්ලීම වූයේ කෝට්ටේ අග නගරයෙහි සිටින ස්වදේශීය විදේශීය මුස්ලිම් ජනයා පැය හයක් යන්නට මත්තෙන් අග නගරයෙන් පලවා හරින ලෙසය. රජු පළමු ඉල්ලීමට මහත් සේ බිය විය. දළදා වහන්සේ අහිමිව ඇති විටක තම මුනුබුරු අන්‍ය ආගමීකරණයට පත් කිරීමෙන් වන අනතුර ඔහු දුටුවේය. රජු ඒ සඳහා කල් ඉල්ලා සිටියේය. එවිට

පෘතුගීසීහු වහා දෙවන ඉල්ලීම ක්‍රියාවට නගන ලෙස බලකර සිටියහ. රජු ඒ අනුව කෝට්ටේ අග නගරයෙහි වැසි සියලු මුස්ලිම් ජනයාව පැය හයක් යන්නට මත්තෙන් රාජධානියෙන් පිටමං වීමේ නිවේදනය නිකුත් කළේය.

ඒ සඳහා පළමු අණ බෙරය වැයුනේ බැද්දගානේ දීය. සියවස් ගණනාවක් මුළුල්ලේ සිංහලයන් සමග සහජීවනයෙන් සිට මුස්ලිම් ජන ප්‍රජාව ඉතිහාසයෙන් ප්‍රථම වරට සිංහල රජෙකු අතින් පිටමං කරනු ලැබීය. වෙළඳුන්, සිටුවරුන්, වෙදුන්, හුදියන්, කවියන්, ආදී විවිධ තරාතිරම් වල මුස්ලිම් ජනයා කෝට්ටේ අත හැර රැකවරණය පතා ගියේ මායාදුන්නේ රජුගේ සීතාවක රාජධානියටය. එමෙන්ම එදින රාත්‍රියෙහි අග නගරයෙන් පිටමං කළ මුස්ලිම් ජනයා සීතාවකට අයත් මල්වාන, හිඹුටාන සහ ගලගෙදරට පලා යන විට කෝට්ටේ අග නගරයෙහි සිටි බෞද්ධ ප්‍රභූන් ද ඔවුන් සමග එක්වීම ඉතිහාස කතා ලතාවේ අසිරිමත් සිදුවීමක් ද වේ. ඒ දළදා වහන්සේ සීතාවක වැඩම වීමද මුස්ලිම් සිංහල ජනයා එකම මොහොතක සීතාවකට පලා යාමද නිසාය.

මේ අනුව සීතාවකට පලා ගිය සාරවත් මුස්ලිම් ජනයා නිසා මායාදුන්නේගේ රාජධානිය ඉසිරුමත් රාජධානිය ලෙස නැගී එන්නට පටන් ගත්තේය. එලෙසම දළදා වහන්සේගේ හිමිකම් ලද මායාදුන්නේ සිරිලක එක් සේසතකට නැගීම සඳහා දේශමාමක

දේශපාලන මුහුණතක පෙරමුණු තරුව බවට පත් විය. සීතාවක ගිල ගැනීමට පැමිණි පෘතුගීසි බලමුළු සතර වටින් වට කර සිඳ දැමූ මායාදුන්නේ මුළු සිරිලක අග රජු වීමට පියවරෙන් පියවර පෙරට පා තබන්නට විය. මේ සඳහා ඔහුට ජාතිමාමක සිංහල බලමුළු ද දේශමාමක මුස්ලිම් බලමුළුවක් ද විය. ඒ අතර බෞද්ධ ධජය ඉහළින් ඔහුට සෙවණ දීම මායාදුන්නේ ලද සැනසිල්ලක් විය. මේ අතර සීතාවකට පැමිණ සිටි මුස්ලිම් ජනයා අතර සිටි විදේශීය අරාබි ජාතිකයින්ට යළි සිය රටවලට යාමට පෘතුගීසීන්ගෙන් ඉඩ නොලැබුණි. පෘතුගීසීන්ගේ මාරක සතුරන් බවට පත් ව සිටි ඔවුහු ස්වදේශීය මුස්ලිම් කතුන් ද සිංහල කතුන් ද සරණ පාවා ගෙන සීතාවක සබරගමු පුරා විසිර පැතිර යන්නට වූහ.

මායාදුන්නේගේ අධිරාජ්‍ය විරෝධී සටනට ජවය දෙන ජනකොටසක් ලෙස මෙම මුස්ලිම් වරු ඉක්මන් ගමනින් සීතාවක සබරගමුව සියනෑ ගම්බිම් පුරා ජනාවාසකරණය වන්න පටන් ගත්හ. මේ අතර දඹදෙණිය යුගයේ සිට කෝට්ටෙ යුගය දක්වා රාජ ලිඛිත සටහන් අතර සනිටුහන්ව ඇති එක් මුස්ලිම් ප්‍රභූ පවුලක් සීතාවක රාජධානිය සමයේ ජනකාන්ත මුස්ලිම් තරු පොකුර බවට පත් විය. ඒ රහමාන් සිද්ධි ලෙබ්බේ මුදියන්සේ නිසාය. රහමාන් සිද්ධි ලෙබ්බේ මුදියන්සේ වූ කලි කතිරිමලි මැණිකේ මුදියන්සේගේ පුත්‍රයාය. මොහොමදූ අස්කාර් ලෙබ්බේ ඔහුගේ පියාය.

සිංහල මවකට ද මුස්ලිම් පියෙකුට ද දාව උපන් රහමාන් මායාදුන්නේගේ දේශමාමක තරුණ බලමුළුවේ සටන්කාමී ගැටවරයා විය. ඔහු වඩාත් තීව්‍ර කතා ලතාවක නිමිත්තක් වන්නේ යාපනය සීතාවකට යා කර අත්වැල අල්ලන මොහොත සඳහා පිටත්ව යාමත් සමගය.
පෘතුගීසීන් යාපනය දෙස බැලුවේ එය නිසරු භූමියක් ලෙසය. කිසිදු අභියෝගයක් නැති පිටමං ජනතාවක් සිටින යාපනයට වෙහෙසීමට පෘතුගීසීහු මැළි වූහ. ඒත් රහමාන් සීතාවක රජු පෙන්නූ ඉව දිගේ මුදුනට නැග ආවේ යාපපන තොටමුණට පා තබන සිංහල රජුගේ පළමු නියෝජිතයා බවට පත් වෙමිනි. ඔහුගේ යාපනය පා තැබීම තත්කාලීන දේශපාලන උණුසුම තීව්‍ර කළ සිදුවීමක් ද විය. එමෙන්ම එතෙක් කෝට්ටේ, සීතාවක, හා රයිගම සහ අතර දෝලනය වූ සිරිලක දේශපාලන කතාන්දරය යළි යාපනය කේන්ද්‍රියව කතාබහට ලක් වීමය. සරුසාර සීතාවකට යාපන භූමිය සමග විශාල වෙරළ තීරුවක් විවර වන බව දත් පෘතුගීසීහු මහත් බියට පත් වූහ.
විශේෂයෙන්ම මේ වන විට කුරුවිට, දොම්පේ, කැලණිමුල්ල සහ කොටිකාවත්ත සටන් වලින් මායාදුන්නේගේ මාරක ප්‍රහාරයට ලක්ව සිටි පෘතුගීසීහු රහමාන්ගේ යාපන ගමනින් වඩාත් තැති ගැන්මකට පත්ව සිටියහ.

රහමාන් සිද්ධි ලෙබ්බේ මුදියන්සේගේ ගැටවර කතාලතා පිළිබඳ අතීත තතු විත්ති වලදී ඔහුගේ රූ වරුණාව ද මහත් වූ සේනා මැදට තනිව පැන සතුරන් පොකුරු පිටින් වනසාලු අපූරු සටහන් ද වේ. එමෙන්ම තම සිංහල මව නිසාම ඔහු කිරි හොදි සමග පොලොස් මාළු ද කෑමට රුසියෙකු බව ද පෘතුගීසි ලේඛක කෘරොස් ලියා තබයි. අන් අතකින් පෘතුගීසීන් ගේ බලය නිසා සීතාවකට පලා ආ අරාබි ජාතිකයන් බහුතරයක් දේශීයකරණය වීම සඳහා රහමාන් බල පෑ සැටි එකල තොරතුරු අතර ලියැවී ඇත්තේය. කෙසේ හෝ රහමාන් මුදියන්සේගේ යාපන යාගමනය නතර කර දැමීමට පෘතුගීසීන්ට නොහැකි විය. මායාදුන්නේගේ බලමුළු යාපනයට ඇතුල්වීම වැළැක්වීමට පෘතුගීසීන් දැරූ තැත වළකා රහමාන් යාපනයට පා නැගුයේ ක්‍රි. ව. 1572 වෙසක් මස 12 වැනිදාය.

මෙම සිදුවීම සමග මායාදුන්නේගේ සිංහල රාජධානියට පෘතුගීසීන් පන්නා දැමීමේ සිහිනය ඇස් ඉදිරිපිට දිස් වන්නට විය. පුත් කුමරෙකු පතමින් රජ මායාදුන්නේ ද ඔහු බිසව සිරිමලී දේවීන්වහන්සේ ද සිදු කළ මහා භාරහාර පල දරමින් පුත් කුමරෙකු පිළිබඳ පුවත සනාථ වුයේ මේ කාල සමයේය. එම නිසා මායාදුන්නේ රජු රහමාන්ගේ යාපන ගමන තම ආත්මීය පැතුම විකසිත කළ සිදුවීම ලෙස ද සිතුවේය. රජ තෙමේ ඔහුට මල්වාන ගම්වරය තෑගී කළේය.

රහමන් සිද්ධි ලෙබ්බේ මුදියන්සේට මායාදුන්නේ රජුගේ සන්නසින් මල්වාන ගම ත්‍යාග ලද බව සැල වූයේ යාපනයේදීය. මල්වාන රහමාන් ගේ මව වූ කතරිමලී මැණිකේ මුදියන්සේගේ ගම ද විය.

ඉතිහාසය මහත් දිගු ගමනකි. එහි සැරිසරන්නට අප හුරුව ඇත්තේ ජනකාන්ත සුලබ සිදුවී මතින් පමණය. ඒත් ඉතිහාසය දුර්ලභ සිදුවීම් සඟවා ගෙන තබා ඇත්තේය. රහමාන් සිද්ධි ලෙබ්බේ මුදියන්සේගේ යාපනය පා තැබීම ද එවන් දුර්ලභ රහසකි.. මෙය රහසක් වූයේ මන්ද? පෘතුගීසි ඉතිහාස ලේඛන වල ද සිංහල ඉතිහාස ද ලියැ වී ඇති ඔහුගේ වික්‍රමාන්විත පා ගමන මුස්ලිම්වරුන්ගේ කතා බහේදීත් සිංහල කතා බහේදීත් මැකී ගියේ මන්දැයි සිතමි. මුස්ලිම්වරුන් ජාතිවාදීව ඉතිහාසය කියවා ගැනීම ද සිංහලයන් ජාතිවාදීව ඉතිහාසය කියවා ගැනීම ද මේ විපතට හේතුවයි.

සමගියේ සංහිඳියාවේ රමණීය ඉතිහාස යුගාන්දරය සැඟවී යටපත් වූයේ එබැවිනි. සිංහලයන් ද මුස්ලිම්වරුන් ද එකට එක්ව හිඳ අනාගතය අරභයා කරන කතාබහට රහමාන් සිද්ධි ලෙබ්බේ මුදියන්සේ නිමිත්ත වන්නේ එවිටය. බොහෝ කල් ගෙවී ගියද මායාදුන්නේ දවස මෙන් නැගිට පිබිද එකට පෙරට ගිය දිනයක් අපට උදා වී නැත. ඒ බැවින් මෙවන් කමණීය රමණීය ඓතිහාසික විරුවෝ ඉතිහාස වැලිතලාවෙන් වැසී අතීත තතු පුවතේ ඇතුල් ගැබ

සැඟවී සිටී. රහමාන් යාපනයට පා තබා එන කල්හි ඔහු ඝාතනය වී ඇත. ඒ කා අතින් කෙලෙස සිදු වූවාදැයි සොයමි. මන්ද රහමාන් සිද්ධි ලෙබ්බේ මුදියන්සේ සිරිලක මහාවංශයට එක් වූ අතුරු ජන වංශයෙහි පහන් තරුවය.”

සුජිත් අක්කරවත්ත

“ලංකාදීප” 2012 මැයි 5 වෙනිදා සෙනසුරාදා.

# ශ්‍රී ලංකා මුස්ලිම් වරුන්ගේ අතීත පිය සටහන්-4

# ලිඛිත ඉතිහාසයට පෙර මැලේ ජාතිකයින් ලංකාවේ වාසය කොට ඇත.

<u>ද සිලෝන් ඩේලි නිව්ස් 1965 නොවැම්බර් 13 වන සෙනසුරාදා - පච්ලිනස් තම්බිමුත්තු විසිනි</u>

“ඉතිහාසයේ පළමු වරට මැලේ ජාතිකයෙකු සෙනෙට් සභාවට පත් කොට තිබේ. ඔහු නම් එම්. ඩී. කිච්ලාන් මහතාය. මැලේ ජාතිකයින් ලංකාවට පැමිණියේ 13 වන ශත වර්ෂයේ දී පමණ යැයි සුප්‍රකට මැලේ නායකයන් විසින් මෑතදී ප්‍රකාශ කොට ඇත. ඉතා ඈත පුරාණයේ සිට ලංකාවේ මිනිසුන් හා මැලේ ජාතිකයින් අතර සම්බන්ධතා පැවති බව රාජකීය ආසියාතික සංගමයේ සඟරාවෙහි “මධ්‍ය කාලීන ලංකාව සහ මලයාසියාව” යන හිසින් ආචාර්ය එස්.පරණවිතාන මහතා විසින් පළ කරන ලද ලිපියක සඳහන් වේ. වාර්තාගත ඉතිහාසයට පූර්ව කාලයේ දී මැලේ ජාතිකයින් විසූ බවට වැඩි දුරටත් සාක්ෂි රාජකීය ආසියාතික සංගමයේ සඟරාවෙහි 1/11 වන වෙළුමේ 257 වන පිටුවෙහි මා විසින් දක්වා ඇත.

ලංකාවේ මානව වංශ විද්‍යා සමීක්ෂණයේදී ජේ. ආර්. ද ලා හෝල් මැරේට සහය වීමේදී රැස්කර ගන්නා ලද කරුණු අළලා ආචාර්ය එන. ඩී. විජේසේකර විසින් ලියන ලද "ලංකාවේ මිනිස්සු" නමැති ග්‍රන්ථයෙහි ඔහු සඳහන් කර ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයක මොන්ගෝලියානු ලක්ෂණ සහ නෙරා ගිය හකු ගර්තයක් සිංහල ජාතියට ඇති බවය.

ඔරුව සඳහා යෙදෙන පොලිනීසියානු වචනය "ඔරු" යන්න බවත් "ඔරුව" යන අපේ සිංහල වචනය එයින් සෑදුනු වදනක් බවත් සිංහලයන්ගේ වෙස් මුහුණු සිංහලයන් සරම අඳින ආකාරය යනාදිය ඉන්දුනීසියානු දූපත් වැසියන්ට සමාන බවත් ඔහු ප්‍රකාශ කරයි. පොලිනීසියානු ජාතිකයින් සහ සිංහලයින් අතර ඇතැම් සමානතා මට දක්නට ලැබී තිබේ. උදාහරණයක් කියතොත් "ඇවිත් කෑම කන්න" යන්න පොලිනීසියානු භාෂාවෙන් කියැවෙන්නේ "නන් මායි එ කායි" යනුවෙනි. කායි යන වදන සිංහල "කන්න" යන වදනට සමානය.

ක්‍රි.පූ. 1,000 වැන්නේ දී පමණ ප්‍රාග්-මැලේ මුහුදු යාත්‍රිකයින් විසින් ද්‍රවිඩ පූර්ව ශිෂ්ටාචාරයක් ඉන්දියාවේ බිහි කළ බව මහාචාර්ය සිල්වේන් ලිවයි ප්‍රකාශ කරයි. ස්ථාන නාම සහ කොල්ලෑ ඔරු මේ බවට දෙස් දෙන බව ඔහු පවසයි. මේ අනුව බලන කළ ලිඛිත ඉතිහාසයට බොහෝ කලකට පෙර ප්‍රාග් මැලේවරුන් ලංකාවට පැමිණි බව සිතිය හැකිය.

හම්බන්තොට යන නාමය සහ "මළල" යන පදයන් ආරම්භ වන හෝ අවසාන වන වෙනත් ස්ථාන නාම මෑත කාලයේ දී ඇති වූ නාම නොවන බව පෙනේ යැයි ආචාර්ය පරණවිතාන පවසයි. ක්‍රිස්තු වර්ෂයට අවුරුදු දහසකට පෙර තරම් අතීතයේ දී කොල්ලෑ බෝට්ටු වලින් ඉන්දියාවට පැමිණීමට තරම් මුහුදු ගමන් ගැන දැනීමක් සහ තාරකා පිළිබඳ දැනීමක් ප්‍රාග් මැලේවරුන්ට තිබුණු බව ආචාර්ය ආර්. වින්ස්ටඩ් ගේ "මලයාවේ ඉතිහාසය" නමැති ග්‍රන්ථයෙහි සඳහන් ව තිබේ. ලංකා විශ්ව විද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ මහාචාර්ය කේ. ඩබ්ලිව්. ගුණවර්ධන යට කී රාජකීය ආසියාතික සංගමයේ සඟරාවකට ලිපියක් සපයමින් ඉහත සඳහන් කරුණු ගැන මෙසේ ප්‍රකාශ කරයි.

"මළල ගේ, මළලසේකර, මළල්ගොඩ වැනි සිංහල වාසගම් බොහොමයක මැලේ සම්බන්ධතාවක් පෙන්නුම් කෙරෙන බව සනිටුහන් කොට ඇතැයි මම අදහස් කරමි. එවැනි නම් ඇති බොහෝ දෙනෙකුට බොහෝ දුරට මැලේ වරුන්ගේ මුහුණුවර තිබීම අහඹුවක් ම විය නොහැක" 1/11 වන වෙළුම, 2 වන කොටස 257 වන පිටුව)

## ආක්‍රමණය

දෙවන පරාක්‍රමබාහු රජු (ක්‍රි. ව. 1236 – 1271) සමයේ දී තමන් ද බෞද්ධයන් යැයි අඟවා ඒ නිසා ලංකාවට පැමිණියේ යැයි කියා ගනිමින් මැලේ ජාතිකයෝ තම

රජු වූ චන්ද්‍රභානු යටතේ ලංකාවට පැමිණියහ. මේ සම්බන්ධයෙන් චූල වංශයේ මෙසේ සඳහන් වේ. "ලංකාවේ සෑම වරායකින්ම දිවයිනට ගොඩ බට මේ නපුරු ජාතික ජා්වායෝ දරුණු සර්පයන් බඳු විෂ ඊ වලින් දකින දකින ජනයාට විද ඉමක් කොණක් නැතිව මිනිසුන් තළා පෙළා ලංකාව විනාශ කළහ." එහෙත් රාජාවලියේ සඳහන් අන්දමට චන්ද්‍රභානුගේ සේනාව ද්‍රවිඩ හෙවායන්ගෙන් සමන්විත වූවකි.

## ටෙනන්ට්

පොලිනීසියාවේ සිට මැඩගස්කාරය දක්වාත් ඉන්දු චීනයේ සිට තහිති දූපත දක්වාත් පැතිර සිටින මලයානු වර්ගයාට සුළු වශයෙන් සමානකම් ලංකාවේ මිනිසුන්ගේ හැඩරුවෙහි ද පුරාණයේ සිට පැවතෙන චාරිත්‍ර වාරිත්‍ර වල ද දක්නට ඇතැයි මානව විද්‍යාඥයන් විසින් සලකනු ලබන බව සර් එමර්සන් ටෙනන්ට් විසින් ශත වර්ෂයකට පමණ ඉහත දී පවසා තිබේ.

ලාංකිකයින් විසින් භාවිත කරනු ලබන කොල්ලෑව සහිත ඔරු සහ කඳන් දෙකේ ඔරු ඉන්දියාවේ අරාබිය පැත්තේ වැසියන් විසින් කිසි විටෙකත් භාවිත නොකරනු ලබන බවත් එකී වර්ගයේ ඔරු මලයා ජාතිකයින්ට විශේෂ වූ ඔරු වර්ගයක් වන අතර ඒවා මලයා ජාතිකයන් සංක්‍රමණය වූ රටවලට පමණක් සීමා වූ බවත් ඊට උදාහරණ මැඩගස්කාරය

කොමෝරෝ දූපත්, සුලු ලුසෝන් සුසයිට් දූපත් සහ ටොන්ගා දූපත් බවත් ඔහු ප්‍රකාශ කරයි.

ලංකාවේ ප්‍රථම පදිංචිකරුවන් චීන ජාතිකයින් බව කියැවෙන ජන ප්‍රවාදයක් ගැන රිබෙයිරෝ නමැති පෘතුගීසි ඉතිහාසඥයා සඳහන් කරයි. ඒ ග්‍රන්ථයේ ඉංග්‍රීසි අනුවාදක වූ ආචාර්ය පෝල් ඊ. පීරිස් විසින් මේ ප්‍රකාශය තම පරිවර්තනයට ඇතුළත් කොට නැත. ඒ ග්‍රන්ථයේ ප්‍රංශ අනුවාදයේ මෙසේ සඳහන් ව තිබේ. "පෘතුගීසි ඉතිහාසඥයින් ප්‍රකාශ කරන කරුණු කෙරේ විශ්වාසය තබන්නේ නම් මේ දිවයිනේ ප්‍රථම ජනාවාසය චීන ජාතිකයින්ගෙන් ඇති වුවක් බව පෙනේ. චීන ජාතිකයින් මුළු පෙරදිග ලෝකයේම සිටි අති දක්ෂ වෙළඳුන් වූ අතර ඔවුන්ගේ ඇතැම් නෞකා මේ දිවයිනට පැමිණ තිබේ."

අවුරුදු දෙදහසකට හෝ තුන්දහසකට පෙර මැලේ ජාතික වෙළෙන්දෝ තම ද්‍රව්‍ය මැඩගස්කාරය, අප්‍රිකානු වෙරළ බඩ ප්‍රදේශ, පර්සියානු බොක්ක හා ඉන්දියාවේ මලබාර් සහ කොරමැන්ඩල් වෙරළ බඩ ප්‍රදේශ යනාදියට ගෙන ගියහ. ඔවුන්ගේ නැව් ලංකාවේ හම්බන්තොට (මැලේ භාෂාවේ "සම්පන්" යන වදනින් සෑදුනකි) සහ ගාල්ල වරාය වලට පැමිණියහ.

ලංකාවේ ස්ථාන නාම වලින්ද මැලේ ජාතිකයින් විසූ ප්‍රදේශ ගැන හෝඩුවාවක් පෙන්නුම් කෙරේ.

යාපනයේ චාවාකච්චේරිය (ජාවාකච්චේරිය), ගාල්ලේ ගඟබොඩ පත්තුවේ පිහිටි ජාගොඩ, ගාල්ලේ පිහිටි ජාකොටුව, කොළඹට නුදුරින් පිහිටි ජාඇල, කොළඹ ජාවත්ත, ගාල්ලේ පිහිටි ජාවෙල මෙවැනි ස්ථාන වලට උදාහරණ වේ.

ජාවා දූපතේ හිටපු රජු වූ සුසුනමක් කුරක් මාස් 1706 දී ලංකාවට පිටුවහල් කරන ලද තැනැත්තෙකි. ලන්දේසීන්ට විරුද්ධව කැරලි ගැසූ මැලේ ජාතික කුමාරවරු සහ ප්‍රධානීහු හතළිස් හතර දෙනෙක් 1723 දී ලංකාවට පිටුවහල් කරනු ලැබූහ. ජාවා දූපතේ රජ මාලිගයේ ප්‍රධාන අමාත්‍යවරයා වූ අනුරගේ ද 1734 දී මෙසේ ලක්දිවට පිටුවහල් කරන ලද තැනැත්තෙකි. මෙසේ පිටුවහල් කරනු ලැබ ලංකාවට පැමිණි මැලේ ජාතික රාජකීයයන්ට මේ හදිසි වෙනස් වීමට අනුකූලව හැඩ ගැසීම අසීරු කාරණාවක් විය. ලන්දේසි ඉතිහාසඥයෙකු වූ වැලන්ටයින් ප්‍රකාශ කරන අන්දමට මැලේ රජුගේ මාලිගය ප්‍රධාන වශයෙන් කාන්තාවන් 10000 ක ගෙන් සමන්විත වූ අතර මොවුන් අතුරෙන් සමහරුන් මුර භටයන් වශයෙන් ද අන්තඃපුර සේවකයන් සහ වෙනත් සේවකයන් වශයෙන් ද යොදවා තිබුණු බව කියැ වේ.

# ජීවිතයට පත්වීම

තුවක්කු සහ හෙල්ල වලින් සන්නද්ධ වූ යෝධ ගැහැනු කණ්ඩායමක් නිරන්තරයෙන්ම රජුගේ ආරක්ෂාවට ඔහු වටා සිටි අතර, අනෙකුත් කාන්තාවෝ ඔහුගේ මැණික් එබූ ජල කෙණ්ඩිය, දුම්කොළ සහ දුම් උරණ උපකරණ, පාවහන්, ලිවීමේ උපකරණ සහ රාජකීය ඡත්‍රය භාරව කටයුතු කළහ.

මැලේ රජුගේ එක් ආහාර වේලකට ආහාර පාන වර්ග පනහක් පමණ මේසයට යවා තිබෙනු දුටු ලන්දෙසිවරු මවිතයට පත් වුහ.

කපිතාන් නුර්දීන් ගේ කථාව මැලේ ජාතිකයන් ගේ අවංක පක්ෂපාත භාවයට හොඳ නිදසුනකි. තමාට සේවය කරන්නේ නම් උසස් තනතුරු දී නින්දගමක් තෑගි කරන බවට උඩරට සිංහල රජතුමා නුර්දීන් ට පොරොන්දු වූ විට තමා බ්‍රිතාන්‍ය ජාතිකයන් ට පක්ෂපාතව ක්‍රියා කිරීමට එවකටත් පොරොන්දු වී තිබුණු හෙයින් රජුගේ ඉල්ලීම නුර්දීන් විසින් ප්‍රතික්ෂේප කරන ලදී. එවිට රජතුමා විසින් කපිතාන් නුර්දීන් සහ ඔහුගේ සහෝදරයා මරුමුවට පත් කරන ලදී.

ලංකාවට පිටුවහල් කරනු ලැබීමෙන් වර්ෂ කිහිපයක් ගතවීමෙන් පසු මැලේ ජාතික කුමාරවරුන්ට ආපසු ජාවා දුපතට යාමට අවසර දෙන ලදී. එහෙත් මෙසේ ආපසු යාමට කැමති වුයේ කිහිප දෙනෙකු පමණි. සෙසු අය ලංකාවේ නැවතී සිටීමට කැමැති වුහ.”

(ද සිලෝන් ඩේලි නිව්ස් 1965 නොවැම්බර් 13 වන සෙනසුරාදා-පව්ලිනස් තම්බිමුත්තු විසිනි)

# මේ රටේ නමක් තැබූ විප්‍රවාසිකයා (ඔරාබි පාෂා)

(ද සිලෝන් ඔබ්සර්වර් 1967 නොවැම්බර් 3 වන සිකුරාදා - මොහමඩ් සමීර් විසිනි)

(කොළඹ මරදානේ "ඔරාබි පාෂා මාවත" යනුවෙන් වීදියක් නම් කොට තිබෙන හේතුව මෙම ලිපියේ කරුණු මගින් පැහැදිලි වනු ඇතැයි අපේක්ෂා කරන්නෙමු.)

ඔරාබි පාෂා වූ කලී බ්‍රිතාන්‍යයන් විසින් ලංකාවට පිටුවහල් කරන ලද මිසර කැරලිකරුවෙකි. ඔහු ලංකාවේ සිටි කාලය වූ 1883 - 1901 අතර කාලයේදී ලංකාවේ මුස්ලිම් ජනතාවගේ සමාජීය, ආගමික හා අධ්‍යාපනික දියුණුව සඳහා මාහැඟි සේවයක් ඉටු කොට ඔවුන් විෂයයෙහි ආකස්මික බලපෑමක් ඇති

කරන ලද තැනැත්තෙකි. මුස්ලිම් ජන නායකයෙකු වූ අභාවප්‍රාප්ත අයි. එල්. එම්. අබ්දුල් අසීස් මහතා සමග එක්වී මුස්ලිම් ජනතාවගේ දියුණුව සඳහා ඔහු කෙතරම් සේවයක් කළේද යත් අබ්දුල් අසීස් මහතාගේ ජන්ම දිනය සහ ඔවුන් දෙදෙනාගේ සාමුහික සේවය අනුස්මරණය කිරීමේ උත්සවයක් පසුගිය සතියේ පවත්වන ලදී.

ඉන්දියාවේ කොටසක් වූ ලංකාව (බ්‍රිතාන්‍ය පාලනය යටතේ) එවකට පාලනය කළ රජුගේ දූත පිරිසක් මුහර්රම් මාසයේ හිජ්රි වර්ෂ 682 හි 14 වැනි දින ඊජිප්තුවට පැමිණි බව අභාවප්‍රාප්ත නීතිඥ ඒ. සී. එම්. අබ්දුල් කාදර් විසින් පළ කරන ලද "නිව් ස්පියර්" නමැති සඟරාවට සුප්‍රකට අරාබි ලේඛකයෙකු හා ඉතිසාසඥයෙකු වූ ජේ. ඒ. විල් පෙරේරා විසින් සපයන ලද ලිපියක උධෘතයක් වශයෙන් දක්වා තිබේ.

"එකී දූත පිරිස යවන ලද්දේ අබු නෙකා ලෙහාදාස් (බුවනෙක බාහු) කුමරුන් විසිනි. එල් භාගයක් දිග හා ඇඟිලි තුනක් පළල රත්රන් මංජුසාවක බහාලූ හසුනක් ඔවුන් විසින් ගෙන යන ලදී. ඒ හසුන තල් කොළයක් වැනි කොළයක ලියා තිබුණු අතර එහි අඩංගු භාෂාව කයිරෝ නගරයේ සිටි කිසිවෙකුට කියැවිය නොහැකි විය. දූත පිරිසගෙන් ප්‍රශ්න කිරීමේ දී එකී තල් පතෙහි ලියා තිබුණේ ආශිංසනයක් සහ මිත්‍රත්වය පැතීමේ සංදේශයක් බව අනාවරණය විය".

## තෑගි

යේමනයේ රජු සමග තිබුණු සම්බන්ධතා තමා විසින් අත්හරින ලද බවත් ඊජිප්තුවේ සුල්තාන්වරයා සමග කිට්ටු සම්බන්ධතාවක් ඇති කර ගැනීමට තමා අපේක්ෂා කරන බවත් ඇතුන් මැණික් සහ සියලුම වර්ගයේ අගනා වස්තු සම්භාරයක් තමා සතුව ඇති අතර සුල්තාන්වරයාට මහඟු ත්‍යාගයක් තමා විසින් එවා ඇති බවත් කුමාරයා විසින් එහි සඳහන් කර තිබුණි. මේ කාලයේදී ලංකාවේ රාජධානියට බලකොටු 27 ක් අයත් ව තිබුණු අතර අගනා රතු මැණික් ඇතුළු විවිධ මැණික් වර්ග ලැබෙන පතල් රාශියක් ද තිබුනි.

ලංකාව එකල හැඳින් වූ සෙයිලාන් නොහොත් සෙරෙන්ඩිබ් යන නාමයන්ගෙන් අරාබි වරුන් ලංකාව ගැන දැන ගෙන සිටියාක් මෙන් ඉන්දියානු සහ චීන නාවික හමුදා වල සේවය කළ ඊජිප්තු නාවිකයන් මගින් ඊජිප්තු ජාතිකයෝද ලංකාව ගැන දැන සිටියහ. කෙසේ වුවද ඈත අතීතයේ පටන්ම ඊජිප්තු සුල්තාන්වරයා විසින් ලංකාව වැදගත් රටක් ලෙස පිළි ගෙන තිබුණි.

ඊජිප්තුව මහ බ්‍රිතාන්‍යයේ ආධිපත්‍යයට යටත්ව තිබුණු මේ කාලයේදී මැද පෙරදිග සහ අප්‍රිකාවේ උතුරු වෙරළ බඩ ප්‍රදේශ ඔටෝමාන් තුර්කිවරුන්ගේ පාලනයට යටත් ව තිබුණි. ඇල්බේනියානු කුමාරයාගේ පරම්පරාවෙන් පැවතෙන්නෙකු ඊජිප්තුවේ ආණ්ඩුකාරයා වශයෙන් තුර්කියේ සුල්තාන්වරයා විසින් පත් කර තිබුණු අතර පසුව ඒ කුමාරයා ඛෙඩිව් යන නමින් ඊජිප්තුවේ පාලකයා බවට පත් විය.

තම මව්බිම බ්‍රිතාන්‍ය ජාතිකයින් විසින් අත් පත් කර ගනු ලැබ විදේශීය බ්‍රිතාන්‍ය ආධිපත්‍යකට යටත් ව සිටීමට සිදු වීම ගැන කණස්සල්ලට පත් ඊජිප්තුවේ ස්වදේශිකයින් අතර ජාතික හැඟීමක් පිබිද ගියෙන් නිදහස සහ ස්වාධීනත්වය ගැන හැඟීමක් මුළු ඊජිප්තුව පුරා පැතිර යන ලදී. මේ අවධියේදී දේශප්‍රේමියෙකු වූ ඔරාබි පාෂා නොසන්සුන් ඊජිප්තු ජනතාවගේ නායකත්වය ගෙන ඔවුන්ගේ ජාතික හැඟීම් එළිපිටම ප්‍රකාශ කරමින් බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව කැරැල්ලක් මෙහෙයවිය. එහෙත් මේ වූ කලී මෙම අරගලයේ ඉතා දුර්වල ආරම්භයකි. මේ කැරැල්ල මැඩ පැවැත්වීම ප්‍රබල බ්‍රිතාන්‍යයන්ට ඉතා පහසු කාර්යයක් විය. ඔරාබි පාෂා සිර භාරයට ගන්නා ලදුව යටත් වීමේ "සුදු කොඩිය" අයථා ලෙස පාවිච්චි කරමින් තම කැරලි කටයුතු ඇලෙක්සන්ඩ්‍රියාවේ තහවුරු කිරීමේ යෙදුණේය යන චෝදනාව යටතේ ඔහුට විරුද්ධව

නඩු විභාග කරන ලදී. මේ නඩු විභාගයේදී ඕරාබි පාෂා සහ ඔහුගේ ආසන්නතම අනුචරයන් වරදකරුවන් බව ප්‍රකාශ කරන ලදුව ඔවුනට මරණීය දඬුවම නියම කරන ලදී. ඉන් පසු එකී දඬුවම ක්‍රියාත්මක කරනු දිනය තෙක් ඔවුහු බන්ධනාගාර ගත කරනු ලැබූහ.

## අපූරු සිද්ධියක්

ඕරාබි පාෂාට මරණීය දණ්ඩනය නියම කරන ලද දිනයේ සිට එය ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණු දිනය දක්වා වූ කාලය තුළදී හදිසියේම අපූරු සිද්ධියක් ඇති විය. එනම්, ඕරාබි පාෂා සහ ඔහුගේ නඩු තීන්දුව පිළිබඳව නිර්නාමික ලිපියක් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ විරුද්ධ පාක්ෂික මන්ත්‍රීවරයෙකු වූ ඕඩොනල්ඩ් මහතාට ලැබුණු බව අයිරිෂ් පාර්ලිමේන්තු සභාරාවට ඒ මහතා ප්‍රකාශ කරනු ලැබීමයි. ඒ ලිපිය මෙසේය:

“මහත්මයාණෙනි,

අපේ සම්භාවනීය වයෝවෘද්ධයාට (එවකට අගමැති ධුරය ඉසුලූ ග්ලැඩ්ස්ටන්) මුණ දීමට තරම් ධෛර්යයක් ඔබට ඇති බව දන්නා නිසා සමාදානය ඇඟවීමට භාවිත කරනු ලබන කොඩි සතුරු හමුදාව මුළා කිරීම පිණිස පාවිච්චි කිරීම සම්බන්ධයෙන් වුල්ස්ලිගේ “යුද භටයන්ගේ අත් පොත” කියවා බලන ලෙස මම ඔබෙන් ඉල්ලා සිටිමි.

යුද්ධ නීතිය ගැන හැදැරීමේදී ග්ලැඩ්ස්ටන් මහතාගේ අවධානය ඒ කෙරෙහි යොමු නොවුවා විය හැකිය.

මේ බවට, විශ්වාස වූ,
දේශපාලන විරුද්ධවාදියෙක්".

යුද හමුදා නියෝග සම්බන්ධයෙන් වූ මේ අත් පොතෙහි සඳහන් ආකාරයට ඔරාබි පාෂා ට මුණ දීමට සිදු වූ අවස්ථාවෝචිත කරුණු අනුව සමාදානය අඟවන කොඩි වෙනත් අන්දමකට පාවිච්චි කිරීමට අවසර තිබේ. ඔරාබි පාෂා කොඩිය පාවිච්චි කර තිබුණේ මෙසේ අවසරය දී තිබුණු ආකාරයකටය. මේ සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියා කළ ඕඩොනල්ඩ් මහතා මේ කාරණය පාර්ලිමේන්තුවේදී මතු කොට පහත දැක්වෙන ප්‍රශ්න පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය.

"තම යුද හමුදාව සහ ආයුධ අලෙක්සන්ඩ්‍රියාවන් ඉවත් කර ගැනීම සඳහා ඔරාබි පාෂා විසින් සමාදානයේ සුදු කොඩිය පාවිච්චි කිරීමෙන් කරන ලද වරද සමාව දිය නොහැකි පාපතර ක්‍රියාවක් බවට අග්‍රාමාත්‍ය තුමා විසින් ප්‍රකාශ කර ඇති හෙයින්, ඔරාබි පාෂා විසින් උපයෝගී කර ගන්නා ලද මේ නින්දිත උපාය මාර්ගයම අනුගමනය කිරීම බ්‍රිතාන්‍ය යුද හමුදාවට නිර්දේශ කරමින් සර් ගාර්නට් වුල්ස්ලි විසින් ලියා ඇති "යුද භටයන්ගේ අත් පොත" නමැති උපදේශ ග්‍රන්ථය බ්‍රිතාන්‍ය යුද හමුදාවේ භාවිතයෙන්

වහාම ඉවත් කිරීමට අග්‍රාමාත්‍යතුමා වහාම පියවර ගන්නේද?”.

මේ විස්මය ජනක අනාවරණය කිරීම හේතු කොට ගෙන අදාළ බලධරයන් අතර ඉමහත් කලබලයක් ඇති වූ අතර මේ ප්‍රශ්නය විවාද කිරීම සඳහා පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමටත් පෙර ඔරාබි පාෂා ට සහ ඔහුගේ අනුචරයන්ට නියම කරන ලද මරණීය දඬුවම ක්‍රියාත්මක නොකරනු ලබන බවත් ඔරාබි පාෂා ට ගරු කරන රටකට ඔහු ඊජිප්තුවෙන් පිටුවහල් කරනු ලබන බවත් නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. තමාගේ මරණීය දණ්ඩනය මෙසේ අපූර්ව ලෙස වෙනස් කරන ලද බවත් ඒ වෙනුවට ඔහු ලංකාවට පිටුවහල් කිරීමට තීරණය කරන ලද බවත් ඇසූ විට ඔරාබි පාෂා ඉමහත් සතුටට පත්විය. ඔහුගේ සතුටට ප්‍රධාන හේතුව වූයේ තම ආදි පීතෘවරයා වූ ආදම්ගේ වාස භූමිය ලංකාව යැයි විශ්වාසයක් එකල තිබීමය.

## පිටුවහල් කිරීම

1882 දෙසැම්බර් 26 වන දින ඔරාබි පාෂා සහ ඔහුගේ අනුචරයන් “මියොට්ස්” නමැති දුම් නැවට නංවා ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිට ලංකාව බලා එන දීර්ඝ ගමනට පිටත් කර එවන ලදී. මේ නැව 1883 ජනවාරි 19 වන දින කොළඹ වරායට සේන්දු විය. මෙදින

සැන්දැවෙහි වරායෙන් ගොඩ බැසීමට ඔවුන්ට ඉඩ නොදී පසු දින ඔවුන් ගොඩ බස්වා කොළඹ පිහිටි බ්‍රේබෲක් හවුස් ස්ටෲවන් හවුස් සහ ලේක් හවුස් යන ස්ථාන වලත් වෙනත් ස්ථාන කිහිපයකත් ඔවුන්ට නවාතැන් පහසුකම් සැලසීමට එකල ලංකාවේ ආණ්ඩුකාරයා වූ ගරු ජේ. ඩග්ලස් මහතා වෛද්‍ය ඕබ්‍රයන් මහතාගේ ද සහය ඇතිව කටයුතු සම්පාදනය කළේය. ආණ්ඩුකාරයාගේ උපදෙස් පරිදි වොන් සහ සමාගමේ ලෙඩ්වර්ඩ් මහතා විසින් යට කී සියලු නිවාස වියදම නොතකා ඉතා මනහර ලෙස අංග සම්පූර්ණ ව ගෘහ භාණ්ඩ ආදියෙන් සජ්පිත කරවන ලදී. මීට අමතරව ඔරාබි පාෂාට වර්ෂයකට පවුම් 800 ක් සහ අනෙකුත් අයට වර්ෂයකට පවුම් 400 සිට පහළට ඒ ඒ මුදල් ප්‍රමාණ දීමනා වශයෙන් ගෙවීමට ද බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් නියම කරන ලදී. පනස්හය දෙනෙකුගෙන් සමන්විත වූ මේ කණ්ඩායම සහ ඔවුන්ගේ පවුල් ඉතා ඉක්මණින්ම මේ අලුත් පරිසරයට හුරු පුරුදු වූහ.

විදේශීය රටකට පිටුවහල් කරනු ලැබුවද ඔරාබි පාෂා ඔවුන් අතර උපශාන්ත හා උදාරතර ජීවිතයක් ගත කළේය. මෙහි දී පුදුම ගෙන දෙන කරුණ වූයේ ඔවුන් ප්‍රථම කොටම ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමට උනන්දුවක් දැක්වීමය. මහත් උද්යෝගයකින් ඔවුහු ඉංග්‍රීසි ඉගෙනීමෙහි යෙදුනහ. ඔරාබි පාෂා මේ කණ්ඩායමේ නායකයා වූ අතර ඔහු ඉතා කිට්ටුවෙන්

ඇසුරු කළ සගයන් හය දෙනෙක් වූහ. ඔවුන් ගෙන් කෙනෙක් ටොවුල්බා පාෂා ය. ඔහුගේ පුත්‍රයා ලංකාව ගැන පොතක් ලියා තිබේ. දෙවැන්නා මොහමඩ් ෆාහිම් වේ. ඔහුගේ මුනුබුරා වූ කාලිඩ් මහ්මුද් දැනට ලෙබනනයේ බේරුට් නගරයේ වාසය කරයි.

ඔරාබි පාෂා ගේ මේ ප්‍රබල අනුචරයන්ගෙන් අබ්දුල් අසීස් කොළඹ දී මිය ගිය අතර ඔහුගේ භූමදානය මහනුවර මහයියාවේ මුස්ලිම් දේවස්ථාන සුසාන භූමියේදී සිදු කරන ලදී. පාෂා ගේ දරුවන් කීපදෙනෙක් මහනුවර කින්ග්ස්වුඩ් විද්‍යාලයේ ඉගෙනුම ලැබූහ. ඔවුහු ඉගෙනීමට දක්ෂයෝ වූහ. පාෂා ගේ එක් පුතෙකු බර්ගර් ජාතික තරුණියක හා විවාහ වීමෙන් ලංකාව සමඟ තිබුණු සම්බන්ධතාව තවත් තර විය. ඒ තරුණිය ඉස්ලාම් දහම වැලඳ ගත් අතර ජමීලා යන නමින් හඳුන් වනු ලැබූවාය. මේ යුවළට ලැබුණු පුත්‍රයා ෆ්‍රෙඩ් ඔරාබි යන නමින් හඳුන්වනු ලදී. මේ වූ කලී ෆරීඩ් යන මුස්ලිම් නාමයේ ඉංග්‍රීසි භාවිතය වේ. මේ පුත්‍රයා කොළඹ වෙස්ලි විද්‍යාලයේ ඉගෙනුම ලැබ පසු කලෙක ඊජිප්තුව ට ගියේය.

ලංකාවේ විසූ මුස්ලිම් ජාතිකයෝ ඊජිප්තු ජාතික ඔරාබි පාෂා මහත් හරසරින් යුතුව පිළිගෙන ඔහුට ගෞරවයෙන් සැලකූහ. ඔවුනතර ඉතා කිට්ටු මිත්‍ර සම්බන්ධයක් ඇති වූ අතර තම දහමට අයත් මේ විදේශීය ආගන්තුකයන්ගේ මෙහි වාසය සැපවත්

කිරීමට සහ ඔවුන්ට තම රටට ආපසු යැමට කටයුතු පිළියෙල කර ගැනීමට දේශීය මුස්ලිම් වරු සෑම අයුරින්ම ඇප උපකාර කළහ.

## ආගමනය

මේ පිටුවහල් කළ පිරිස දිවයිනට පැමිණි නොබෝ කලකින්ම ඉස්මායිල් ලෙබ්බෙ මරික්කාර් ආලිම් ගේ ප්‍රධානත්වයෙන් ලංකා මුස්ලිම් පිරිසක් මක්කා නගරයට හජ්ජි වන්දනා ගමනක් යාමට සූදානම් වූහ. මේ හජ්ජි වන්දනාකරුවන් මගින් ඊජිප්තුවේ සිටින තම නෑ හිතමිතුරන්ට ලියුම් සහ තෑගී බෝග යැවීමට මාහැඟි අවස්ථාවක් පිටුවහල් කරනු ලැබූ කණ්ඩායමට මේ නිසා ලැබිණි. තමාට සමාව දෙන ලෙස ඉල්ලන පෙත්සමක් ඔරාබි පාෂා විසින් පිළියෙල කරන ලදුව වන්දනා කණ්ඩායම විසින් ඒ පෙත්සම කොට්ට උරයක් තුළ බහා රහසේම ඊජිප්තුවට ගෙන යන ලදී. එහෙත් අවාසනාවකට මෙන් ඒ පෙත්සමෙන් පලක් නොවීය. පිටුවහල් කිරීමට තීරණය කළ වහාම මෙවැනි පෙත්සමක් ගැන සලකා බැලීම පවා ඉක්මන් වැඩි යැයි නිලධාරීහු කල්පනා කළහ. මෙකල සිදු වූ තවත් අහඹුවක් නම් ලංකාවේ ආණ්ඩුකාර ධුරයට සර් විලියම් ග්‍රෙගරි පත්ව ඒමය. ඔහු ඊජිප්තුවේ සිටි කාලයේදී ඔරාබි පාෂා දැන හැඳිනගෙන සිටියේය.

ලංකාවට පිටුවහල් කොට සිටියදී ඔරාබි පාෂා විසින් සර් විලියම් ග්‍රෙගරි සමග තිබුණු දැන හැඳුනුම්කම්

අලුත් කර ගන්නා ලද නමුත් ඉක්මණින් සමාවක් ලැබ ආපසු ඊජිප්තුවට යාමට ඔරාබි පාෂාට උපකාර කිරීමට ආණ්ඩුකාරයාට නොහැකි විය. දේශීය මුස්ලිම් ජනතාව සමග නිදහසේ මිශ්‍ර වූ ඔරාබි පාෂා ඔවුන්ගේ ආගමික, අධ්‍යාපනික, සහ සමාජ කටයුතු වලට නොමඳව සහයෝගය දැක්වීය. මෙයින් දෙපක්ෂයම නොයෙකුත් දේ ඉගෙන ගත්හ. ශ්‍රීමත් රාසික් ෆරීඩ් ගේ සීයා වූ වාපිච්චි මරික්කාර් ගේ නායකත්වය යටතේ මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපනය නගා සිටුවීමට විශේෂ උත්සාහයක් සහ උනන්දුවක් ඔරාබි පාෂා විසින් ගන්නා ලදී. ඔරාබි පාෂා වාපිච්චි මරික්කාර් ට කෙතරම් සමීපවුයේ ද යත් ඔවුනතර හිතවත්කම හා මිත්‍රත්වය හුවා දැක්වීමක් වශයෙන් ඔහු වාපිච්චි මරික්කාර් ට ආමන්ත්‍රණය කළේ අල් වාපිච්චි යනුවෙනි. මේ කාලයේදී සහිරා විද්‍යාලයේ ප්‍රථම තෑගී බෙදා දීමේ උත්සවයේ ප්‍රධාන අමුත්තා වශයෙන් ඔරාබි පාෂාට ආරාධනය කිරීම ඔහු වෙත දක්වන ලද ඉමහත් ගෞරවයක් ලෙස ඔහු විසින් සලකන ලදී. තේජාන්විත පෙනුමකින් යුත් ඔහු මේ උත්සවයට පැමිණීම එහි පැමිණ සිටි සැම දෙනා තුළම මහත් භක්ති ප්‍රණාමයක් ඇති කිරීමට සමත් වූ අතර එය එකී අධ්‍යාපන ආයතනයට කරන ලද මහත් ගෞරවයක් ලෙස සලකන ලදී.

## තාවකාලික වාසය

ඔරාබි පාෂා මේ දිවයිනේ වාසය කළ කාලය තුළදී ඔහු සමග ඉතා ළඟින් ආශ්‍රය කළ තැනැත්තෙකි අභාවප්‍රාප්ත හජ්ජි ඉස්මයිල් ඉෆෙන්ඩි. ඔරාබි පාෂා ව මනා ලෙස හදාරා ඉස්ලාම් දහමේ ප්‍රතිපත්ති සහ ඉගැන්වීම් ගැන හොඳ අවබෝධයක් ලබා සිටි හජ්ජි ඉස්මයිල් ඉෆෙන්ඩි ඔරාබි පාෂා ගේ ඉතා හිතවත් මිතුරෙකු වුවා පමණක් නොව ඔහු ප්‍රකාශ කළ සෑම දෙයක් ම පාහේ පරිවර්තනය කොට සෙස්සන්ට කියා දීමේ මාධ්‍යය ද විය. මෙසේ ඊජිප්තුවේ සිට පැමිණි කණ්ඩායමේ නායකයා සමග හජ්ජි ඉස්මයිල් ඉෆෙන්ඩි නිරතුරුවම ඇසුරු කළා පමණක් නොව, ඔහුගේ ඇසුර බොහෝ විට පැතූ අනෙකුත් පාෂා වරුන්ට ද නන් අයුරින් උපකාර කළේය.. ඔහු බොහෝ විට ඔවුන්ගේ සමාගමෙහි තම කාලය ගත කළේය.

මින් අනතුරුව සහිරා විද්‍යාලයේ  පවත්වන ලද ක්‍රීඩා උළෙලට ඔරාබි පාෂා පැමිණ එය විශිෂ්ට අවස්ථාවක් බවට පත් කළේය. මේ උත්සවය සිහිපත් කිරීම සඳහා ඔරාබි පාෂා විසින් සහිරා විද්‍යාල භූමියෙහි පොල් පැළයක් රෝපණය කරන ලදී. මේ පොල් ගස මෑතක් වන තුරුම එහි තිබුණි. වාපිච්චි මරික්කාර් විසින් සහිරා විද්‍යාලයට තෑගී කරන ලද නව ගොඩනැගිල්ලට අන්තරායකාරී ලෙස මේ පොල් ගස ඇලව තිබුණු හෙයින් සහිරා විද්‍යාලයේ විදුහල්පති විසින් මරදාන මුස්ලිම් දේවස්ථානයේ කළමනාකාර භාරකරු වෙත

කරන ලද ඉල්ලීමක් පරිදි මේ පොල් ගස කපා දැමීම සිදු විය. අනතුරුදායක තත්වයේ පැවති මේ පොල් ගස කපා දමන ලද අවස්ථාවේ දී කළමනාකාර භාරකරුගේ ඥානාන්විත ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් එකී පොල් ගසේ ගෙඩියක් මුල් ගස තිබුණු ස්ථානයට සමීප ස්ථානයක සිටුවන ලදී. මේ පොල් ගෙඩියෙන් හට ගත් පොල් ගස අදත් මනා ලෙස වැඩී තිබේ.

1901 වර්ෂය ආරම්භ වත්ම ඔරාබි පාෂා ට ක්‍ෂමාව දෙන ලද බව දන්වා එවන්නට යෙදුණෙන් ඔහුට සහ ඔහුගේ පිරිසට ආපසු සිය රට බලා යාමට අවසර දෙන ලදී. මේ ආරංචියෙන් ඔරාබි පාෂා සතුටටත් කනගාටුවටත් පත් විය. තම රටට ආපසු යාමට ලැබීම ගැන ඔහු සතුටු වූ අතර තම හිත මිතුරන්ගෙන් වෙන් වීම ගැන ඔහු කනගාටු විය. ඔරාබි පාෂා ට සහ ඔහුගේ සහයකයන්ට ශුභ පැතීමේ විශාල උත්සවයක් හමීදියා පාසල් ගොඩනැගිල්ලේදී පවත්වන ලදී. මේ මාහැඟි උත්සවයේදී ශුභාශිංසනය කිරීමේ අරාබි ගීත ගායනා කරන ලද අතර ඒ කණ්ඩායමට නිරුපද්‍රිතව තම මව් බිම කරා යාමට ශුභ පතා යාඥා පවත්වන ලදී. පිටුවහල් කර සිටි කණ්ඩායමේ ඒ ඒ අයට ඒ ඒ අවස්ථාවේ දී ක්‍ෂමාව දෙන ලද හෙයින් වරින් වර ඔවුන්ගෙන් ඇතැමෙකු එවකටත් තම රට කරා ගොස් තිබිණි. කෙසේ වුව ද අවසානයට ඉතිරි වූ

කණ්ඩායමට ඔරාබි පාෂා ඇතුළත් වූ අතර ඔහු මෙරට හැර යනු දැකීම හද කකියවන සිද්ධියක් විය.

මේ කාලයේදී මා බාල වියේ පසු වූ ළමයෙකු වුව ද එක්තරා අන්දමකින් මා ද ඔරාබි පාෂා සමඟ ළඟින් ඇසුරු කළ කෙනෙකු වන හෙයින් ඔහුගේ මව් රටට සුවසේ ආපසු යාමට ඔහුට සහ ඔහුගේ පිරිසට ලැබේවා යැයි ප්‍රාර්ථනා කරමින් මගේ මිය ගිය මව විසින් පබැඳ තිබුණු යාච්ඤාවක් අඩංගු ලිපියක් ඔහු අතට දීමේ වරප්‍රසාදය මට ලැබුණු බව මෙහිදී සඳහන් කිරීම අනුචිත නොවේ යැයි මම සිතමි. ඔරාබි පාෂා මෙරටින් පිට වී යාමේ දී ඔහු පිටත් වුයේ කරීම්ජී ජාෆර්ජීගේ නිවසේ සිටය. බම්බලපිටියේ පිහිටි ඊසා විලා නමැති මේ නිවසේ ඔහු ආගන්තුකයෙකු වශයෙන් නැවතී සිටීය. ඔහුගේ මිත්‍රයන්ගේ සහ ඔහු ඇසුරු කළ අයගේ ප්‍රීති ඝෝෂා සහ ආශීර්වාද මැද ඔහු 1901 සැප්තැම්බර් 18 වන දින මේ දිවයිනෙන් පිටත් විය.

<u>(ද සිලෝන් ඔබ්සර්වර් 1967 නොවැම්බර් 3 වන සිකුරාදා - මොහමඩ් සමීර් විසිනි)</u>

# ශ්‍රී ලංකා මුස්ලිම් වරුන්ගේ අතීත පිය සටහන්-5

## ඓතිහාසික අතීතයට එබී බැලීමක්

මුහම්මද් මන්සූර් දහ්ලාන්

(ජාතික කෞතුගාරයේ හිටපු සහකාර අධ්‍යක්ෂක සී. එම්. ඔස්ටින් ද සිල්වා බී. ඒ. විසිනි)

මහනුවර රජ කළ 11 වන රාජසිංහ රජු (ක්‍රි. ව. 1635 – 1687) ඌවේ දී පෘතුගීසීන් සමග කළ සටනකින් පැරද තම ජීවිතය බේරා ගැනීමට පලා ගියේය. ඔහු මෙසේ පලා යද්දී පඹරගම්මන නමැති ගමට පැමිණියේය. එහිදී විශාල බෙනයක් සහිත කොස් ගසක් දුටුවේය. ගව මඩුවක් අසල පිහිටි මේ කොස් බෙනයේ රජු සැඟවුණේය. පසු පස එළවා ගෙන පැමිණි පෘතුගීසි සොල්දාදුවන්ට මේ ගව මඩුව අසල දී හදිසියේම රජුගේ අතුරුදහන්වීම මහත් ප්‍රහේලිකාවක් විය. මේ අවස්ථාවේ දී කිරි දොවමින් සිටි යෝනක ස්ත්‍රියකගෙන් පෘතුගීසි සොල්දාදුවෝ රජු ගැන විමසූහ. රජු සැඟවුණු ස්ථානය ගැන ඇය ඔවුන්ට

නොකීමෙන් ඔවුහු ඇය කැබලි කැබලි කොට කපා මරා දැමූහ. රජු බෙරි දිවි ගලවා ගැනීමෙන් පසු රජු වෙනුවෙන් දිවි පිදූ මේ හිතවත් ස්ත්‍රියගේ අවාසනාවන්ත ඉරණම ගැන රජුට අසන්නට ලැබුණේය. ඇගේ නාමයට උපහාරයක් වශයෙන් පඟරගම්මන නිවැසි යෝනක වරුන්ට විශාල ගම්වරයක් රජු විසින් තෑගි කරන ලදී.

කිවුලේ ගෙදර බණ්ඩාරගේ පෙම් පුවතටද පඟරගම්මන යෝනක ග්‍රාමය සම්බන්ධ වේ. සිංහල ප්‍රභූවරයෙකු වූ කිවුලේ ගෙදර කුඩා මොහොට්ටාල ආලයෙන් වෙලී ගිය රූමත් යෝනක තරුණියක් මේ ගමේ විසූ බව කියනු ලැබේ. මේ තරුණිය විවාහ කර ගැනීමට තමා ආශා කරන බව ඔහු ඇගේ දෙමව්පියන්ට දන්වා ඔවුන්ගේ කැමැත්ත විමසූ විට එක්තරා කොන්දේසියක් මත තමන් ඊට කැමති වන බව ඔවුහු ප්‍රකාශ කළහ. ඔවුන්ගේ කොන්දේසිය වූයේ "වී අමුණු තිහක කුඹුරක් අපට තිබේ. දැන් ඒ කුඹුරේ ගොයම් පැසී ඇත. ඔබ තනිවම ඒ කුඹුරේ ගොයම් හෙට එක් දිනෙන් කපා අවසන් කළහොත් අපේ දුව ඔබට සරණ පාවා දෙමු" යන්නයි. අප්‍රහති ධෛර්යයෙන් අනූන වූ කිවුලේ ගෙදර බණ්ඩාර

තනිවම එක් දිනකින් ඒ කුඹුරේ ගොයම් කපා මේ කොන්දේසිය ඉටු කළෙන් එකී රූමත් යෝනක තරුණිය ඔහුට විවාහ කර දෙන ලදී.

## තම අන්තිම කැමති පත්‍රයෙන් ශ්‍රී ලංකාව පෘතුගීසීන්ට උරුම කළ නරපතියෙක්

(සුමිත්ත කුරුප්පු විසිනි - 1964 ජුලි 15 වන දින - සිලෝන් ඩේලි නිව්ස් පුවත්පත)

සීතාවක නුවර සතුරු රාජධානියක් පිහිට වූ තම බාලම සහෝදරයා වූ මායාදුන්නේ රජුගේ අපේක්ෂාවන් නිසා කෝට්ටේ සිංහාසනයට උරුමකරුවකු පත් කර ගැනීමේ ප්‍රශ්නය සම්බන්ධයෙන් බුවනෙකබාහු රජුට තම සැලකිල්ල මෙන්ම තීක්ෂණ බුද්ධිය ද මෙහෙයවීමට සිදු විය. කීහිප අවස්ථාවකදීම මායාදුන්නේ කෝට්ටේ වැටලුවේය. තම උත්සාහය සාර්ථක කර ගැනීමට ඔහු ඉන්දියාවේ කලිකට් හි පාලකයා වූ සැමොරින්ගේ සහය පවා ඉල්ලා සිටියේය. සැමොරින් වරක් තම විශිෂ්ටයන් දෙදෙනෙකු වූ පච්ච මරික්කාර් සහ කුන්හල මරික්කාර්

යටතේ ද නැවත වරක් අලි ඉබ්‍රාහිම් යටතේ ද මායාදුන්නේට සහය දුන්නේය. පෘතුගීසීන්ගේ මැදිහත්වීම නිසාම මුස්ලිම්වරුන්ට පසු බැසීමට සිදු විය (ක්‍රි. ව. 1528).

සීතාවක රාජධානියට එරෙහිව තම රාජධානියේ ආරක්ෂාව ඇතිකරලීම සඳහා බුවනෙකබාහු රජුට පෘතුගීසීන් කෙරෙහි විශ්වාසය තැබීමට සිදු වූයෙන් කෝට්ටේ රාජධානියේ බලය පිරිහීමට පත් වූ අතර පෘතුගීසීන්ගේ බලය වැඩි දියුණු වන්නට විය. බුවනෙකබාහු රජුගේ දියණිය වූ සමුද්‍රා දේවී කුමරිය ‘එඩිතර ඇස් ඇති උස් වූ දේහයකින් හෙබි නිර්භීත’ වීදිය බණ්ඩාර කුමරුට විවාහ කර දෙනු ලැබිණ. ඔවුන්ට දාව උපන් ධර්මපාල කුමරු තම අනුප්‍රාප්තිකයා වශයෙන් පත් කිරීමට බුවනෙකබාහු රජු තීරණය කළේය. මේ අරමුණ මුදුන් පත් කර ගැනීමට බුවනෙකබාහු රජු විශේෂ ක්‍රමයක් අනුගමනය කළ අතර ඔටුනු පලන් රජුන් සම්බන්ධයෙන් එය විශිෂ්ට සිද්ධියකි. බ්‍රාහ්මණයෙකු වූ ශ්‍රී රාජපක්ෂ පණ්ඩිත සහ සල්ලප්පු ආරච්චි යන දෙදෙනා යටතේ බුවනෙකබාහු රජු පෘතුගාලයේ රජු වෙත රාජ දූත පිරිසක් යැව්වේය. එම දූත පිරිස

ධර්මපාල කුමරුගේ ප්‍රතිමාවක් ලිස්බන් නගරයට ගෙන ගිය අතර 1543 දී පමණ ලිස්බන් හි දී ඊට කිරුළු පැලඳවීය. ප්‍රතිමාවේ හිස ඇත් දළින් සහ රනින් කරන ලද්දක් වූ අතර එහි කය රිදීයෙන් කරනු ලැබිණ. ප්‍රතිමාවේ අතක ඔටුන්නක් විය.

# ප්‍රතිමාව

සිංහල තානාපතිවරුන් පිළිගැනීමට මුළු පෘතුගීසි රජවාසලම ලිස්බන් වරායට පැමිණ සිටි අතර, පෘතුගීසි මාර්ක්විස්වරයන් දෙදෙනෙකු විසින් ඔවුන් රාජ්‍යය ගෞරව සහිතව රජවාසල වෙත කැඳවාගෙන යන ලදී. එම ප්‍රතිමාවට ඔටුනු පැලඳ වූ දිනය පෘතුගාලය පුරා නිවාඩු දිනයක් බවට ප්‍රකාශයට පත් කෙරිණ. පෘතුගීසි රජ මාලිගයේ චාරිත්‍රානුකූලව උත්සවශ්‍රීයෙන් එම ප්‍රතිමාවට ඔටුනු පැලඳ වීය. ධර්මපාල කුමරු බුවනෙකබාහු රජුගේ උරුමකරු වශයෙන් පෘතුගාලයේ රජු විසින් පිළිගත් අතර එවක් පටන් ධර්මපාල කුමරු පෘතුගාලයේ රජුගේ ආරක්ෂාව ලැබුවේය. ඒ වන විට පෘතුගීසීන් සඳහා ලංකාවේ වෙන් කොට තිබු ප්‍රදේශ තබා ගැනීමට බුවනෙකබාහු රජු පෘතුගාලයේ දොන් ජුආම් රජුට ඉඩ දුන් අතර

පෘතුගීසීන්ට ආධාර මුදලක් ගෙවීමට ද බුවනෙකබාහු රජු එකඟ වුයේය. එම නියමයෙන් ස්ථිර කෙරෙන රාජකීය ප්‍රකාශයක් (අල්වාරා) ඔටුනු පැලඳ වීමේ උත්සවයේදීත් නිකුත් කරන ලදී. එකී මෞලි මංගල්‍යයට පෘතුගාලයේ (ෆිඩල්ගෝස්) සහභාගී වූ අතර ගෞරවයක් වශයෙන් ගොන් පොර සහ වෙනත් උත්සව පවත් වනු ලැබිණ.

අසනීපයකින් පසුව යථා තත්ත්වයට පත්වෙමින් සිටි බුවනෙකබාහු රජු කැලණි ගඟ අසබඩ විවේකීව සිටියදී පෘතුගීසි භේවායෙකු විසින් පත්තු කරන ලද තුවක්කුවකින් රජුගේ හිස තුවාල විය. ඒ අවස්ථාවේ දී රජු තම මාලිගයේ ඉහළ මාලයේ සිටියේය. කෙසේ වුවුද එය මාරාන්තික වෙඩි පහරක් විය. රාජාවලිය ලියු ලේඛකයා දක්වන අන්දමට “එය යම් කාර්යයක් අරභයා කරන ලද්දකි. එහෙත් ඇතැම් අය දක්වන අන්දමට එය අහම්බෙන් සිදු වූවකි. මේ සම්බන්ධයෙන් සත්‍යය දන්නේ දෙවියන් පමණකි”.

# දොන් අල්ෆොන්සෝ ද නොරොඤ්ඤ ගේ පැමිණීම

ධර්මපාල කුමරු සිංහාසනාරූඪ වූ විට ඔහුගේ පියා වූ වීදිය බණ්ඩාර තම පුත්‍රයාගේ බාල කාලය තුළ ඔහුගේ රාජ්‍ය අනුශාසක වුයේය. ඒ අවදියේදී ගෝවේ සාමන්තයා වූ දොන් අල්ෆොන්සෝ ද නොරොඤ්ඤ ගේ පැමිණීම වැදගත් සිද්ධියක් විය. නැව් 70 කින් සමන්විත විශාල නාවික හමුදාවක්ද 3000 කින් සමන්විත සේනාංකයක් ද ඔහු සමග පැමිණි අතර 1551 වර්ෂයේ දී මායාදුන්නේගේ රාජධානිය ආක්‍රමණය කොට වස්තුව පැහැර ගැනීමට ඔවුන්ට අවස්ථාව ලැබිණ. ආක්‍රමණය සඳහා ගිය වියදම වශයෙන් පෘතුගීසි සාමන්තයා පර්දාවෝ 200,000 ක මුදලක් බුවනෙකබාහු රජුගෙන් ඉල්ලා සිටියේය. රට වැසියන් භීතියට පත් කරමින් පෘතුගීසීන් කෝට්ටේ නගරය විනාශ කරන්නට විය. පෘතුගීසි භේවායන්ගේ තාඩන පීඩන වලට රට වැසියන් ගොදුරු වුහ. රට වැසියන්ගෙන් වස්තු සම්භාරයක් කොල්ලකා ගත් පෘතුගීසීහු සිංහල ස්ත්‍රීන් දූෂණය කළහ. මෙවැනි බිහිසුණු තත්ත්වයක් ඇති වුයෙන් වීදිය බණ්ඩාරට කරකියාගත හැකි දෙයක් නොවීය. පෘතුගීසීන්ට මුහුණ දීමට තරම් බලකායක් ඔහුට නොතිබූ හෙයින් වීදිය බණ්ඩාර පලා ගියේය.

රජ මාලිගය පවා කොල්ලකරුවන්ට ගොදුරු විය. වෙනෙකක් තබා රජුගේ රත්තරන් පඩික්කන් පවා පෘතුගීසි සාමන්තයා විසින් කොල්ලකනු ලැබීය. රජු හා සාමන්තයා අතර ඇති කර ගන්නා ලද ගිවිසුම අනුව ආක්‍රමණයෙන් කොල්ලකා ගත් වස්තුවෙන් අඩක් රජුට දීමට එකඟ වූ නමුත් එය ක්‍රියාත්මක කිරීම ඔහු ප්‍රතික්ෂේප කළේය. "ක්‍රිස්තියානි භක්තිකයෙකු සමඟ වූ පොරොන්දුවක් ඉන්දියානුවෙකු විසින් කඩ කරනු ලැබුවේ නම් ඔහු ම්ලේච්ඡයෙකි. එහෙත් ම්ලේච්ඡයෙකු සමග ඇති කර ගන්නා ලද පොරොන්දුවක් කඩ කරන ක්‍රිස්තියානි භක්තිකයා කවරෙකු දැයි මම නොදනිමි. ඇතැම් විට පඬිවරු දනිති" යනුවෙන් ඔහුගේම රටවැසියන් විසින් මේ කාරණය සම්බන්ධයෙන් ප්‍රකාශ කරනු ලැබිණ.

සාමාන්තයාට ලැබිය යුතු ඉතිරි මුදල වෙනුවෙන් රජ පවුලේ සාමාජිකයෙකු වන්දියක් වශයෙන් අත් අඩංගුවට ගන්නා ලද අතර රන් මෙඛලාවක් දීමෙන් සහ ඉතිරි කොටස වෙනුවෙන් පොරොන්දු නෝට්ටුවක් දීමෙන් පමණක් ඔහුට තම නිදහස ලබා ගැනීමට හැකි විය. මෙම නිදසුන් වලින් පෙනී යනුයේ පෘතුගීසීන් විසින් කරන ලද කෲරතර කටයුතුය. උසස්

පෘතුගීසි පාලකයෝද මේ ක්‍රියාවලියම අනුගමනය කළහ.

# සහනය

සාමන්තයා පිටත්ව යෑමෙන් පසුව වීදිය බණ්ඩාර ආපසු කෝට්ටේ රාජධානියට පැමිණියේය. ඔහු කොළඹ කොටුව භාරව සිටි පෘතුගීසි නියෝජිතයා මරණයට පත් කළේය. ස්වදේශිකයන් කතෝලික ආගමට හරවා ගැනීම තහනම් කළ ඔහු පූජක වරුන් පලවා හැරියේය. මොවුන්ගෙන් ඇතැම් පූජකවරු වනගත වූහ. සම්ප්‍රදායක් වශයෙන් විවිධ ආගම් ඇදහීමේ සහනය ඇති මෙරට ඉතිහාසයෙහි පාලකයා එක් ආගමකට එරෙහිව කටයුතු කළ අවස්ථාවක් මෙය විය.

“විතර්ක ශක්තිය පමණක් බල පැවැත්විය යුතු ක්ෂේත්‍රයන් හි තමන් විසින් බලය පාවිච්චි කර නොමැති බව සිංහලයෝ සාඩම්බරයෙන් පවසති. බුද්ධ ධර්මයට මුල්තැන් දුන් බෞද්ධ රජවරුන් විසින් හින්දු දෙවිවරුන් වෙනුවෙන් දේවාල ඉදිකොට ඇත. මුස්ලිම් වරුන්ට අයත් වූ ද ඔවුන් වාසය කරන්නාවූ ද ගම් වල ඇති බෞද්ධ සිද්ධස්ථාන වල මුස්ලිම්

ජනයාගේ ආගමික වතාවත් කිරීමට ඉඩ දී තිබේ. ක්‍රිස්තියානි ධර්ම දූත පිරිස් මෙරටට එවන ලෙස බුවනෙකබාහු රජු විසින් ඉල්ලා සිටියේ මෙවැනි පෘථුල හැඟීමක් ඇතිවය. රජුගේ යටත් වැසියන් විසින් ද එම ධර්මදූත පිරිස් පිළිගනු ලැබුවේ එවැනි හැඟීමක් ඇතිවය" යනුවෙන් ශ්‍රීමත් ආචාර්ය පෝල් ඊ. පීරිස් දක්වා ඇත. එසේ වුව ද පෘතුගීසීන්ගේ හැසිරීම නිසා මීට ඉඳුරාම වෙනස් තත්ත්වයක් ඇති විය.

පිළිම වන්දනාව සම්බන්ධයෙන් සිංහල රජවරුන්ගේ ආකල්පය පෘතුගීසීන්ගේ ආකල්පයට ප්‍රතිවිරුද්ධ විය. "මිථ්‍යා දෘෂ්ටික ආගමික උත්සව ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලික වශයෙන් පවත්වන්නන් හෝ ඒවාට අනුබල දෙන්නන් හෝ බ්‍රාහ්මණයන් ආරක්ෂා කරන්නන් ක්‍රිස්තුස් වහන්සේගේ සතුරන්ය. එමනිසා ඔවුන්ට දඬුවම් කළ යුතුයැ" යි 1546 දී පෘතුගාලයේ රජු විසින් සාමන්තයා වෙත එවන ලද ආඥාවක සඳහන් වෙයි. තවද එම පණිවිඩයේ මෙසේ සඳහන් වේ. "මිථ්‍යා දෘෂ්ටිකයන් ශුභාරංචිය පිළිගන්නේ විශ්වාසයේ ශුද්ධවන්ත භාවය ගැන ඒත්තුයාමක් නිසා නොවන හෙයින් සහ සදාකාලික ජීවිතය ගැන බලාපොරොත්තුව නිසාම නොවන හෙයින් ඔවුන්ගේ

හදවත් සැහැල්ලු කිරීම වැනි ලෞකික සහන සැලසීමෙන් ඔවුන්ට ධෛර්යය දිය යුතුය. තව ද ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය කිරීමේ ක්‍රමයක් වශයෙන් මෙතැන් සිට ඉදිරියට ක්‍රිස්තියානි ආගම වැලඳ ගන්නන් කප්පම් ගෙවීමෙන් නිදහස් කළ යුතු අතර ඔවුන්ට මෙතෙක් කල් නොදී තිබුණු යම් යම් වරප්‍රසාද සහ නිලතල දීමෙන් ඔවුන් දිරි ගැන්විය යුතුය".

# වීදිය බණ්ඩාර

තම කටයුතු කර ගෙන යෑමට වීදිය බණ්ඩාර බාධකයක් බව පෘතුගීසීන්ට අවබෝධ විය. එම නිසා ඔවුහු වීදිය බණ්ඩාර සිරභාරයට ගෙන බිංගෙයක සිරකොට තැබූහ. එවිට ඔහුගේ භාර්යාව සමුද්‍ර දෙවි කුමරිය රයිගමට පලා ගොස් වෘත්තියෙන් පතල්කරුවන් වූ පහත් කුලයකට අයත් පතල්කරුවන්ගේ සහය ලැබ උමගක් සාදා ඔහුට පලා යෑමට අවස්ථාව සලසා දුන්නාය.

ඉන් පසුව වීදිය බණ්ඩාර පස්දුන් කෝරළයේ සීමාවේ ඇති කඳු ප්‍රදේශයෙ හි ආරක්ෂාව සඳහා ගොස් පෘතුගීසීන්ගෙන් පළි ගැනීමේ ව්‍යායාමයක යෙදුණේය. මුහුදු බඩ ප්‍රදේශයෙ හි ඔහුට එරෙහි වූ

සෑම පෘතුගීසි ජාතිකයෙකුම ඔහු ජීවිතක්ෂයට පත් කළේය. ඔහු ද්වේෂ කළ පරංගීන්ගේ සංකේතය වූ ක්‍රිස්තියානි දේවස්ථාන විනාශ කළේය. වීදිය බණ්ඩාරගේ භාර්යාව වූ සමුද්‍ර දේවිය මරණයට පත් වුයෙන් කෝට්ටේ රාජධානිය තම අණසක යටතට ගෙන ඒමේ අවස්ථාවක් දුටු මායාදුන්නෝ වැන්දඹුවක් වූ තම දියණිය වීදිය බණ්ඩාර ට විවාහ කොට දුන්නේය. දේශපාලන වශයෙන් පෘථුල ප්‍රතිඵල ඇති විය හැකි වූ මේ ගිවිසුම අභ්‍යන්තර ගැටුමක් නිසා පුස්සක් බවට පත් විය. වීදිය බණ්ඩාර තම දෙවන භාර්යාවට කෲර අන්දමින් සලකන්නට විය. මෙය මාමණ්ඩිය සහ බෑනණ්ඩිය අතර ආරාවුලකට හේතු විය. කෝපාවිෂ්ට වූ මායාදුන්නෝ ක්‍රි. ව. 1555 දී වීදිය බණ්ඩාරට විරුද්ධ ව පෘතුගීසීන් සමග ගිවිසුමක් ඇති කර ගත් අතර වීදිය බණ්ඩාර තහවුරු කර ගෙන සිටි කඳුකර ප්‍රදේශයෙන් නෙරපීමට ද කටයුතු සංවිධානය කළේය.

එකල ලාබාල තරුණයෙකු වූ මායාදුන්නේගේ බාල පුත්‍රයා වූ ටිකිරි බණ්ඩාර (පසුව රාජසිංහ) තම මස්සිනා වූ වීදිය බණ්ඩාර කන්ද උඩරට ප්‍රදේශයට එළවා දැමීමේ සටනේ දී කැපී පෙනුණු පුද්ගලයෙකු විය. ඔහු

වීදිය බණ්ඩාර එළවා දමා තම සොහොයුරිය ඇතෙකු පිට නංවා ආපසු සීතාවක ට එව්වේය. අවසානයේදී යාපනයට පලාගිය වීදිය බණ්ඩාර ත්‍රාසජනක මරණයකට ගොදුරු විය.

# ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම

පෘතුගීසීන් ට මුහුදු තීරයේ ධීවර ජනයාගෙන් 70,000 ක් පමණ දෙනා ක්‍රිස්තියානී ආගමට හරවා ගැනීමට හැකි විය. ක්‍රි. ව. 1557 දී ධර්මපාල රජු හා ඔහුගේ බිසව බෞතීස්ම කිරීමෙන් ආගම පැතිරවීමේ ව්‍යායාමය උච්ච ස්ථානයට පත් විය. ධර්මපාල රජු දොන් ජොආවෝ නොහොත් දොන් ජුවාන් යනුවෙන් ද ඔහුගේ බිසව පෘතුගාලයේ රැජිනට ගරු කිරීමක් වශයෙන් දෝන කැතරිනා යනුවෙන් ද හඳුන් වනු ලැබිණ. රජවාසල අධිපතීන් බොහෝ දෙනාද රජු අනුගමනය කරන්නට වූහ. මිථ්‍යාදෘෂ්ටිකයින් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීමේ මෙන්ම මුළු මහත් දිවයිනම ආධ්‍යාත්මික වශයෙන් යටත් කර ගැනීමේ කර්තව්‍යය ඉටු කර ගනු පිණිස දේව වරමින් පත් කළ නියෝජිතයෙකු ලෙස ෆැන්සිස්කානු පූජකවරුන් විසින් ධර්මපාල රජතුමා පිළි ගනු ලැබිණ.

මින් පසුව බෞද්ධ සහ හින්දු සිද්ධස්ථාන වලට අයත් ඉඩම් ක්‍රිස්තියානි දේවස්ථාන වල සහ ධර්ම දූත ව්‍යාපාර වල ප්‍රයෝජනය සඳහා වෙන් විය. කතෝලික පූජකවරු රජුගේ උපදේශකයින් බවට පත් වූහ. දළදා මාලිගාවට අයත් වූ ස්ථානය ක්‍රිස්තියානි දේවස්ථානයට හිමි විය. මෙයින් උද්ගත වූ තත්ත්වය නිසා දළදා වහන්සේ ද කෝට්ටෙන් අතුරුදහන් විය. මේ අවදියේදී සිටි සිංහල ජාතිකාභිමානයක් ඇත්තන්ගේ නෙත් සිත් සීතාවක දෙසට යොමු වූ අතර දළදා වහන්සේගේ භාරකාරයන් විසින් රහසේම එය සීතාවකට ගෙන යන ලදී. ක්‍රිස්තියානි ආගම වැලඳ ගැනීමත් සමග ධර්මපාල රජු මෙතෙක් කල් සිංහල ජාතිකයින් විසින් අනුගමනය කරන ලද සම්ප්‍රදාය බිඳ දැම්මේය. මෙතෙක් පැවති විශ්වාසය අනුව බෞද්ධ කුමරෙකු ශ්‍රී ලංකාවේ රජ විය යුතුය. ධර්මපාල රජු බෞද්ධ යටත් වැසියන්ගෙන් ඈත් විය. ඔහු ක්‍රිස්තියානි ආගම වැලඳ ගැනීමත් සමග පෘතුගීසීන් විසින් කෝට්ටේ රාජධානිය අල්ලා ගැනීමේ කාර්ය සම්පූර්ණ විය.

# රුකඩ රජු

වීදිය බණ්ඩාරගේ මරණින් පසුව උද්ගත වූ ප්‍රශ්න වලට එඩිතර ව මුහුණ දිය හැකි ශක්තිමත් නායකයෙකු කෝට්ටේ රාජවංශය අනුගමනය කළවුන්ට ඇති නොවීය. රාජසිංහ රජුගේ ආක්‍රමණ නිසා කෝට්ටේ ආරක්ෂා කර ගැනීම පෘතුගීසීන්ට දුෂ්කර කාර්යයක් විය. එම නිසා 1565 දී පැරණි කෝට්ටේ රාජධානිය අත් හැර දමනු ලැබිණ. ඉන් පසු ධර්මපාල රජු කොළඹ කොටුවෙහි ම වාසය කළ අතර ඔහුගේ රාජ සභාව ද එහි ම පවත්වනු ලැබිණ. ධර්මපාල රජු ඔහුගේ යටත් වැසියන්ගෙන් ඈත් වූ රුකඩ රජෙකු බවට පත් විය. ඔහු පෘතුගීසි නිලධාරීන්ට වඩාත් සමීප වූ අතර එදිනෙදා රාජ්‍ය කටයුතු සම්බන්ධයෙන් මැදිහත් වීමට ද පෘතුගීසීන් ට අවකාශය ලැබිණ.

ඇතැම් අවස්ථාවල දී රජෙකු වශයෙන් තම ගෞරවයට හානි වන අයුරින් කටයුතු කිරීමට ද ඔහුට බල කෙරිණ. පෘතුගීසි නිලධාරීන්ගේ හිතුවක්කාර ක්‍රියා කලාපයට විරුද්ධ ව පෘතුගාලයේ රජුට ධර්මපාල රජු විසින් තම විරෝධය පළ කරන ලද

අතර කොළඹ පෘතුගීසි කපිතාන් වරයාගෙන් ස්වාධීන වූ අපක්ෂපාත මුරකාවල කපිතාන් වරයෙකු පත් කරන ලෙස ඔහු පෘතුගාල රජුගෙන් ඉල්ලා සිටියේය. පෘතුගීසි නිලධාරියෙකු විසින් ධර්මපාල රජුට වස දීමට තැත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහුගේ දත් වැටුණු අතර ඔහු ගොත ගසන්නෙකු ලෙසට ද පත් විය.

ධර්මපාල රජුගේ සියලු බලතල පෘතුගීසීන් විසින් උදුරා ගනු ලැබූ අතර විඳ දරා ගත නොහැකි කරදර හිරිහැර වලට ද ඔහු පාත්‍ර කරන ලදී. 1597 දී ඔහු මිය ගිය අතර ඔහුගේ අන්තිම කැමති පත්‍රයෙන් කෝට්ටේ රාජධානිය පෘතුගාලයේ රජුට උරුම කර තිබුණේය.

“සීලම් පෙරියා ෆැන්ඩර් රජෝත්තමයාගේ අනුග්‍රහයෙන් අති උත්තම දොන් ජුවාම් කුමාරයා” ශාන්ත ෆ්‍රැන්සිස්ගේ කන්‍යාරාමයේ දී මෙරටෙහි දී දෙනු ලැබිය හැකි උසස්ම පෘතුගීසි රාජ්‍ය ගෞරව ඇතිව මිහිදන් කරන ලදී. ප්‍රථම වතාවට මෙන්ම අවසන් වතාවට ද සිංහල රජෙකු ක්‍රිස්තියානි පිළිවෙත් අනුව මිහිදන් කරන ලද අතර ඔහුගේ ආත්මය වෙනුවෙන් යාච්ඤා කරනු ලැබිණ.

# ශ්‍රී ලංකා මුස්ලිම් වරුන්ගේ අතීත පිය සටහන්-6.

## සිංහල මුස්ලිම් අතීත සබඳතා

(ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නන්ද ධර්මරත්න මහතා විසිනි - ඉරිදා ලංකාදීප - 2013 පෙබරවාරි මස 3 වැනිදා ඉරිදා)

සහෝදරත්වය නම් බැඳීමෙන් උනුන් බැඳී සිටි වගට ඉතිහාසය මැනවින් සාක්ෂි දරයි. උනුන් ලෙසින් සඳහන් කළේ සිංහලයන් හා මුස්ලිම් වරුන්ය. මුස්ලිම් වරුන්ගේ ඉතිහාසය සොයා යන ගමනේ දී ඔවුන් දුරාතීතයේ සිටම ලංකාව හා ලංකාවේ රාජ්‍ය පාලකයන් සමග සබඳතා පැවැත් වූ බවට සාක්ෂි ඉතිහාසයෙන් හමු වේ. ඒ සබඳතා ආර්ථික හා දේශපාලන යනුවෙන් දෙයාකාර වේ. 7-8 සියවස් වෙද්දී අරාබීන් හෙවත් මුස්ලිම්වරු වෙළෙඳාම මුල් කර ගෙන මේ රට සමග දැඩි සබඳතාවන් ගොඩ නගා ගෙන තිබුණි.

එපමණක් නොව අරාබි ජාතිකයින් ලංකාව ගැන ලියූ මූලාශ්‍ර දෙස බැලීමේ දී ඔවුන් දැඩි අවධානයක් ලංකාව සම්බන්ධ ව යොමු කර ඇති බවට සාක්ෂි මුණ ගැසේ.

ඉස්ලාම් දහම පහළ වීමට බොහෝ කලකට පෙර පටන් අරාබි ජාතිකයෝ ලංකාව ගැන දැන සිටියහ. ග්‍රීකයන්ට හා රෝම වරුන්ට මේ රටේ තොරතුරු දැන ගන්නට ලැබුණේ අරාබි සංචාරකයන්ගෙනි.

එසේ වුවත් අරාබිවරු ලියන ලද ග්‍රන්ථ වලට ලංකාව පිළිබඳ තොරතුරු ඇතුළත් කරන ලද්දේ ඉස්ලාම් දහම ඇති වුණාට පසුවය. පළමුවෙන්ම මෙවැනි දේශාටන වර්ණනයක් ක්‍රි. ව. 950 දී පමණ අහූසයියිද් නමැත්තා 'සිල් සිලක් අල් කවාරි' නම් ග්‍රන්ථයට ලංකාව ගැන තොරතුරු ඇතුළත් කෙරුණි. ඉන් අනතුරුව ලංකාව ගැන අනගි වර්ණනාවක් කළ මුස්ලිම් ලේඛකයා වන්නේ ඉබ්නු බුර්දාද් නැමැත්තාය. ඒ සියලු කරුණු ඒකරාශී කර 10 වැනි සියවසේ දී පමණ මසූදි නම් ලේඛකයා තවත් ග්‍රන්ථයක් ලීවේය. ඉන් අනතුරුව මක්දීසි වැනි ලේඛකයන් ද ලංකාව ගැන ලුහුඬින් සඳහන් කිරීම් කළේය.

පසු කලක අබුල් තීදා වැනි භූගෝල විද්‍යාඥයන් ද ලංකාව ගැන සඳහන් කර ඇත. ඒ සියලු මුස්ලිම් ලේඛකයන් අතර වඩාත් වැදගත් වන්නේ 14 වැනි සියවසේ මේ රටේ සංචාරය කළ ඉබ්නු බතූතා ගේ වාර්තාවය. විශේෂයෙන්ම මුස්ලිම් ජාතිකයෝ 7 වැනි සියවස වෙද්දී බටහිර දෙසට යන මුහුදු මාර්ගයන් හි ආධිපත්‍යය ලබා ගෙන සිටියහ. දකුණු ඉන්දියාවේ

චෝල පාණ්ඩය යන රාජ්‍යයන් යටපත් වීමත් සමගම අරාබි බලය දියුණු වුයේය. එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රි. ව. 949 වෙද්දී අරාබි නැව් වෙළෙඳ ගනු දෙනු සඳහා කොළඹට පැමිණියේය. 8 වැනි ශත වර්ෂයේ සිට මුස්ලිම් වරු විශාල පිරිසක් ලංකාවේ වුහ.

ලංකාවේ සිටි මේ මුස්ලිම්වරු ලාංකික මුස්ලිම්වරු හා මුහුදුබඩ මුස්ලිම්වරු යනුවෙන් හැඳින් වුහ. අරාබි බලය දකුණු ඉන්දියාවේ වර්ධනය වුවාට පසුව මුස්ලිම්වරු වෙළෙඳ ගනු දෙනු සඳහා කොළඹට පැමිණියහ. මෙයත් සමග අරාබි වෙළෙන්දෝ කොළඹ පදිංචි වුහ. 1505 දී පෘතුගීසීන් පැමිණීමට බොහෝ කලකට පෙර අරාබීහු ලංකාවේ මුහුදුබඩ පෙදෙස් වල වෙළෙඳාමේ තනි අයිතිය හිමි කර ගනිමින් සිංහල රජුත් සිංහල වැසියනුත් සමග සාමකාමී සහජීවනයෙන් යුතු දිවි පෙවෙතක් ගත කළහ. ඔවුන් ලංකාව හැඳින් වුයේ සෙරෙන්ඩිබ් යන නමිනි.

මේ කාලය වන විට අරාබි මුහුදේ නැගෙනහිර කොටසේ ප්‍රධාන වෙළෙඳ පොළ වුයේ කොල්ලම් නම් ස්ථානයයි. මේ ස්ථානයේ සිට මාර්ග දෙකක් විහිදී තිබුණි. 9 – 10 වැනි සියවස් හි අරාබි නැවියන් ලියු වාර්තා වල මේ ගැන සඳහන් වෙයි. එයින් එක් මාර්ගයක් වැටී තිබුණේ මන්නාරම් බොක්කේ සිට ගංගා නදී මෝය දක්වාය. අනික් මාර්ගය නිකොබාර්

දුපත ඔස්සේ වැටී තිබුණි. එපමණකුදු නොවේ. ලක්බිමේ උපන් සෑම ද්‍රව්‍යයන් කෙරේම මුස්ලිම් ජාතිකයෝ බලවත් සැලකිල්ලක් දැක්වූහ. ඔවුහු කුළු බඩු නිෂ්පාදන පෙර අපර දෙදිග රටවල් වෙත ගෙන ගියහ. මුස්ලිම් වෙළෙඳ ප්‍රජාවක් ලංකාවේ බිහි වූයේ මෙපරිදිය.

මේ ප්‍රජාවට අයත් වැන්දඹුවන් හා අනාථ දරුවන් පිරිසක් මව් රටට යැවීමේ කටයුතු එකල ලංකාවේ රජතුමා විසින් කරන ලද බවක් 8 වැනි ශත වර්ෂය පිළිබඳව ලියැවුණු ඉතිහාස සටහනක සඳහන් වෙයි. ඉන් පෙනී යන්නේ සිංහල පාලකයන් මුස්ලිම් වෙළෙඳ ප්‍රජාව කෙතරම් ආරක්ෂා කළා ද යන්නය. අරාබි මුස්ලිම්වරු ලංකාවේ මැණික් ගැන හැම විටම විශේෂ උනන්දුවක් දැක්වූහ. එදා ලංකාව හැඳින් වූ නමක් වූයේ රත්න ද්වීපය යන්නය. ඒ නමට සමාන අරුත් ඇති නමකින් මුස්ලිම්වරු ද ලංකාව හැඳින් වූහ. ඒ නම වූයේ 'ජසීරත් අල් යකූත්' (මැණික් දිවයින) යන්නය. ඔවුන් ලංකාවෙන් පිටරට යැවීමට කටයුතු කළේ මැණික් මුතු හක්ගෙඩි කුළු බඩු වැනි වටිනා ද්‍රව්‍යයන්ය. මෙම මුස්ලිම් වරුන් ලංකාවේ පදිංචි වූයේ බලහත්කාරයෙන් හෝ ආයුධ බලයකින් හෝ නොවේ. මේ රටේ රජවරුන්ගේ අනුග්‍රහය හා අනුමැතිය මෙන්ම පෞද්ගලික ව්‍යාපාර වල ප්‍රතිඵලයක් ලෙසත් ය.

මුහුදුබඩ ප්‍රදේශයේ මේ අන්දමට පදිංචි වූ මුස්ලිම් වරුන්ට තම ආගම අදහන්නට සිංහල පාලකයන් ආගමික සහනශීලිතාව ගරු කරමින් පහසුකම් සලසා දුන් බවත් සිංහල පාලකයන් තුළින් ඒ ආගමික සහනශීලිතාව මැනවින් දිස් වූ බවත් අරාබි ග්‍රන්ථ කතු වරුන් විසින් සඳහන් කර තිබේ. මුස්ලිම් වරුන් ලංකාවේ බටහිර වෙරළ තීරයේ සුදුසු තැන් වලත් විශේෂයෙන්ම කලපුව අසලත් සිංහල වැසියන්ගේ හා පාලකයින්ගේ ආරක්ෂාව හා කාරුණික සැලකිලි ලබමින් ජීවත් වූහ. මුහුදුබඩ ප්‍රදේශයේ එවකට පදිංචි වූ මුස්ලිම්වරු ශ්‍රීපාද කන්දට ආසන්න ප්‍රදේශයේ මැණික් ඇති තැන් සොයා යෑමේ වෑයමට ද ප්‍රවේශ වූහ. එවැනි දේ වූයේ ලාංකික රජවරුන්ගේ චාරිත්‍රානුකූල අනුමැතියට අමතරව ලාංකික ජනතාව ඔවුන් වෙත ලබා දුන් සහාය ද හේතුවෙනි.

මුස්ලිම් ව්‍යාප්තිය යාපහුව රාජධානි සමය වන විට තවත් වර්ධනය විය. යාපහුව පාලකයා වූ පළමු වැනි බුවනෙකබාහු රජු මුස්ලිම් රටක් වූ ඊජිප්තුව සමග 1283 දී වෙළෙඳ ගිවිසුමක් ද ඇති කර ගත්තේය. එදා ඊජිප්තුවේ රජවාසලට ලංකාවේ වෙළෙඳ දූත පිරිසක් සිංහල රජුගේ සංදේශයක් රැගෙන ගියහ. එහි මෙසේ සඳහන් වෙයි.

“ලංකාව ඊජිප්තුවයි. ඊජිප්තුව ලංකාවයි. මගේ දූතයන් ආපසු එන විට ඊජිප්තුවේ දූතයෙකු ඔවුන් සමග එනු

ඇතැයි බලාපොරොත්තු වෙමි. සෑම වර්ගයක ම මැණික් හා මුතු අති විශාල ප්‍රමාණයක් මා සතුව තිබේ. නැව්, ඇතුන්, රෙදි, අගිල්, කුරුඳු වැනි සියලු වාණිජ ද්‍රව්‍යයන් ඔබට එවමි. තෝමර තැනීමට සුදුසු ලී ගස් මගේ රාජ්‍යයෙහි වැවේ. අවුරුදු පතා නැව් 20 ක් එවන්නැයි සුල්තාන් තුමා මට කියතොත් ඒවා සැපයීමට මට පුළුවන. එතුමාගේ විජිත වල වෙළෙන්දන්ට මගේ රාජ්‍යයේ වෙළෙඳාම් කිරීමට සම්පූර්ණ නිදහස තිබේ. මට අයත් මාලිගා 29 ක් තිබේ. ඒවායේ භාණ්ඩාගාර හැම වර්ගයක ම මැණික් වලින් පිරී තිබේ. මුතුපර තිබේ. එයින් ගනු ලබන සියලු මුතු මා සතුය."

මෙවැනි වෙළෙඳ ගිවිසුමක් ඇති කර ගැනීමෙන් පැහැදිලි වන්නේ අපේ රට මුස්ලිම් රටවල් සමග හොඳ සම්බන්ධතාවක් පැවැත් වූ බවයි. මෙය එකී සබඳතාව තහවුරු කරන එක් උදාහරණයක් පමණි. ගාල්ලේ තිබී භාෂා තුනකින් ලියැවුණු සෙල් ලිපියක් හමු විය. එම සෙල් ලිපිය ලියා තිබුණේ චීන දෙමළ පර්සියානු භාෂා වලිනි. 14 වන සියවසේ ලංකාවට ආ ඉබ්නු බතූතා ශ්‍රී පාද කන්දට යද්දී ලංකාවේ පාලකයා එම ගමනේ දී සෑහෙන්න ඔහුට අනුග්‍රහයන් ලබා දුන් බව එහි කියැවේ. මේ ආකාරයේ සෑහෙන සබඳතාවක් මුස්ලිම් වරුන් හා සිංහල ජනයා අතර එම යුගය වෙද්දී ඇති වී තිබුණි.

තවද සීතාවක රාජධානියේ මායාදුන්න රජුට කෝට්ටේ බුවනෙකබාහු හා පෘතුගීසීන් සමඟ සටනට යන්නට සම්පූර්ණ සහය හා අනුබලය දුන්නේ ද ඉන්දියානු සාගරයේ එවකට ආධිපත්‍යය ලබා ගෙන සිටි සැටොරින් නම් වෙළෙඳ කණ්ඩායම විසිනි. සැටොරින් යනු මුස්ලිම් වරුන් ය. මේ වෙළෙඳ කණ්ඩායම සීතාවක රාජධානියත් සමග හොඳ වෙළෙඳ හා මිත්‍රශීලී සබඳතාවක් පවත්වා ගෙන ගොස් ඇත.

මේ රට අධිරාජ්‍යවාදීන්ගෙන් නිදහස් කර ගැනීමේ අරගලය හෙවත් නිදහස් සටන් ව්‍යාපාරයට මුස්ලිම් නායකයෙකු වූ ටී. බී. ජායා මහතා මහත් වූ දායකත්වයක් ලබා දුන්නේය. එදා මේ රටේ සිංහල, දමිළ, මුස්ලිම් භේදයක් තිබුණේ නැත. එදා නිදහස් සටනට මේ මුස්ලිම් නායකයා ලබා දුන් සහයට කෘතගුණ දැක්වීමක් වශයෙන් කොළඹ නගරයේ මාවතක් ටී. බී. ජායා මාවත ලෙස නම් කෙරුණි. ඔහු එදා මේ රටේ නිදහස වෙනුවෙන් සිංහල නායකයන් සමග උරෙනුර ගැටී සටන් කළේය.

**සාමය සමගිය පතුරාලා**

**කුල වාද භේදය දුරලාලා**

**සැම උපකාරය නංවාලා**

## අපි හැදෙමු වැඩෙමු එක්සත් වීලා

එදා සිංහලයන් දමිළයන් හා මුස්ලිම් වරුන් කටයුතු කළේ එකී හැඟීමෙන් හා සහෝදරත්ව බැඳීමෙන් බව එකී සබඳතාවේ අක් මුල් සොයා යන ගමනේ දී ඉතාහාසය විසින් පහදන සත්‍යයයි.

# ශ්‍රී ලංකා මුස්ලිම් වරුන්ගේ අතීත පිය සටහන්-7.

# සුප්‍රසිද්ධ යෝනක වෛද්‍ය පරම්පරාව

(මූලාශ්‍රය: "ශ්‍රී ලංකා යෝනක වරුන්ගේ අතීත පිය සටහන්" - යෝනක ඉස්ලාමීය සංස්කෘතික නිකේතනය - කොළඹ)

කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක දිප්පිටියේ ගැටබේරිය වලව්වේ විසූ පල්කුඹුරේ වෛද්‍යතිලක රාජකරුණා ගෝපාලන අධිකාරම් මුදියන්සේලාගේ බෙත්ගේ හජ්ජි මුහන්දිරම් සේගු මුහම්මද් උඩයාර් නිලමේගේ පරම්පරාවේ ආදිම මුතුන් මිත්තා ක්‍රි. ව. 1155 දී පමණ ස්පාඤ්ඤයේ යෝනක රාජ්‍ය පරම්පරාවේ නවාබ් රජතුමාගේ කාලයේ වයඹ දිග ග්‍රනඩාවේ විසූ පඬිවරයෙකු වන අබූ බක්කර් මුහම්මද් ඉබ්නු අබ්දුල් මලික් ඉබ්නු තුෆයිල් බව සොයා ගෙන ඇත. ටික කාලයක් මක්කමේ වාසය කිරීමෙන් පසු මේ අය ඔවුන් යටතේ පැවති මිසරයට සහ ගෝවට පැමිණියහ. මේ පවුලේ එක් ශාඛාවක් උතුරු ඉන්දියාවේ පදිංචි වී සිටියහ. කෝට්ටේ රජ කළ ශ්‍රී සඟබෝ ශ්‍රී පරාක්‍රමබාහු රජතුමාගේ ආරාධනය පරිදි

ඉන් දෙදෙනෙක් ශ්‍රී ලංකාවට පැමිණ පදිංචි වී ඔවුන්ගේ පරම්පරාගත වෛද්‍ය කර්මයෙහි යෙදෙමින් සිටියහ. සිවිල් සහ යුද්ධ කටයුතු වලදී ඔවුන්ගේ සේවය රජවරුන් සහ රදලවරුන් විසින් නිතර නිතරම ලබා ගෙන ඇත. මෙයින් එක් වෛද්‍යවරයෙකු විමලධර්මසූරිය රජු යටතේ 1597 දී වෙරළාරක්ෂ හමුදාවල අණදෙන නිලධාරී පදවිය දැරූ හමුදා සෙන්පතියෙකුව සිටීය. අවසානයේදී ලන්දේසීන් විසින් කල්පිටියේදී ඔහු අල්ලා මරණයට පත් කර ඇත. ඔහුගේ මුතුන් මිත්තන් සියලු දෙනාම එතෙක් වෛද්‍යවරුන් වශයෙන් රාජ සභාවේ සේවය කර ඇත. මේ පවුල් උසස් සිංහල පවුල් සමග සම්බන්ධකම් ඇති කර ගත්හ. මේ ලිපිය ලියන ලේඛකයාගේ මව් පාර්ශවයේ මී මිත්තනිය කැප්පෙටිපොළ පවුලේ කෙනෙකි.

පසු කාල වල දී සිටි අවසාන රජවරුන්ගේ කාලයේදී ඔහුගේ මුත්තෙකු වන රාජකරුණා ගෝපාල මුදියන්සේ රාලහාමි පිළිමතලාවේ සහ ඇහැළේපොළ අධිකාරම් වරු සමග අපරාධ හා සිවිල් නඩු විසඳීමෙහි දී රාජාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු වශයෙන් කටයුතු කළේය. මෙවැනි සේවාවන් සඳහා ඔහුගේ මුතුන් මිත්තන්ට ප්‍රදානය කළ නොයෙකුත් නින්දගම් අතර පහත සඳහන් ප්‍රදානයන් වැදගත් වේ.

ක්‍රි. ව. 1553 දී සෙනරත් රජතුමාගේ සන්නස

ක්‍රි. ව. 1567 දී රාජසිංහ රජතුමාගේ සන්නස

ක්‍රි. ව. 1597 දී විමලධර්මසූරිය රජතුමාගේ සන්නස

ක්‍රි. ව. 1661 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ සන්නස

ක්‍රි. ව. 1683 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ සන්නස

මෙම සන්නස් පත්‍ර මහනුවර දිස්ත්‍රික්කයේ විවිධ පළාත් වල ඉඩම් සම්බන්ධයෙන් නිකුත් කර ඇති ඒවාය. 1815 දී මහනුවර රාජධානිය ඉංග්‍රීසීන්ට භාර දුන් පසුව ඔහුගේ පවුලේ සාමාජිකයන් විසින් බ්‍රිතාන්‍යයන් යටතේ මෙම මහජන සේවය දිගටම කර ගෙන යන ලදී. 1828 දී මැණික්දිවෙල රාජකරුණා වෛද්‍යතිලක මුදියන්සේගේ ඇවෑමෙන් පලුඹුර වෛද්‍යතිලක රාජකරුණා ගෝපාල මුදියන්සේලාගේ සේගු මුහම්මදු වෙදරාළ එම ධුරයට පත් කරන ලදී. එය මෙසේ සඳහන් කර ඇත.

“බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ කැමැත්ත ඇතිතාක් කල් එම ධුරය දැරීමට සහ ධුරයේ කටයුතු කිරීමට පත් කරනු ලබන අතර එකී ධුරය ප්‍රකාරව උඩරට පළාත් වල සිරිත් විරිත් හා සම්ප්‍රදාය අනුව ඔබට ගෞරව දැක්වීමට හා කීකරු වීමට අදාළ සියලු ජනතාවට මෙයින් නියම කර සිටිනු ලැබේ”.

1828 මාර්තු මාසයේ 5 වන දින මහනුවර දී ජී. ගිබ්සන් ජේ. සී. සහ මහනුවර කොමසාරිස් ජෝර්ජ්

සිමන්ස් යන අයගේ අත්සන යටතේ නිකුත් කරන ලදී.

මේ තැනැත්තාගෙන් පසු ඔහුගේ පුත්‍රයා එනම් මෙම ලිපය සකස් කළ අයගේ මුත්තා වන සේගු මදාර් උඩයාර් 1928 මාර්තු මස 20 වන දින දරණ ආඥා පත්‍රය මගින් එම ධුරයට පත් කරන ලදී. ඔහුගේ මෙම ධුරයට ප්‍රදේශයේ ගම්මුලාදෑනි තනතුර ද ඇතුළත් විය. මෙම ලියුම්කරු පසු කාලයේදී මෙම ධුරයට පත් කරන ලදී. එතැන් සිට මේ දක්වා ඔහු ආණ්ඩුවට පක්ෂපාතව සේවය කර ඇත. ඔහුට මුහන්දිරම් ධුරයද මහා රැජින විසින් ප්‍රදානය කරන ලද මෞලි මංගල්‍ය පදක්කම ද ලැබී ඇත. ලංකාවේ පුරා විද්‍යා කොමසාරිස් සිවිල් නිලධාරී එච්. එස්. ආර්. බෙල් මහතාගේ කෑගල්ල පෞරාණික පර්යේෂණ වල උද්ධෘතයක් මෙහි පරිශිෂ්ටයේ දක්වා ඇත.

# පරිශිෂ්ටය

කෑගල්ල පෞරාණික පර්යේෂණ

ගැටබෙරිය සන්නස

කීර්ති ශ්‍රී රාජසිංහ

ගෝපාල යෝනකවරුන්ගේ ගම වන ගැටබෙරිය පිහිටා ඇත්තේ පරණකුරු කෝරළේ තුම්පළාත් පත්තුවේ මොරගම්මන හා ගෙවිලෙපිටිය සිට

හෙට්ටිමුල්ල දක්වා ඇති අප්‍රධාන මාර්ගයේ සැ. 1.5 ක් පමණ දුරිනි.

ඔවුන් ලංකාවේ පදිංචියට පැමිණි ආකාරය ගැන ඔවුන් කරන විස්තරය මෙසේය. ඔවුන්ගේ මුතුන් මිත්තෝ කෝට්ටේ මහවාසල සමයේදී ගෝවේ සිට මෙහි පැමිණියහ. ඔවුන් ලංකාවේ පහතරට පදිංචි වී බොහෝ කලකට පසුව වෛද්‍ය වරුන් වශයෙන් ඔවුන්ගේ කීර්තිය ගැන මහනුවර රජතුමාට සැලවී "ඔජරය" නම් උදර රෝගයකින් පෙළෙමින් සිටි බවට සැක කරන ලද රජ බිසවට ප්‍රතිකාර කිරීම සඳහා ඔවුන් ව මහනුවරට ගෙන්වා ගන්නා ලදී. ඔවුන්ගේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීම පිණිස රජතුමා පහත දැක්වෙන ක්‍රමය අනුගමනය කළේය.

වෛද්‍යවරයාට රෝගියා නොපෙනෙන පරිදි රෝගියා කාමරයක තබන ලදී. රජ බිසවගේ අත අල්ලා නාඩි බැලීමට වෛද්‍යවරයාට අවසර නැති විය. වෛද්‍යවරයා රැවටීම සඳහා නූලක කෙළවර දොර පොල්ලක බැඳ අනික් කෙළවර වෛද්‍යවරයාට දෙන ලදී. වෛද්‍යවරයා නූල අල්ලා බලා කීවේ මෙය පණ ඇති කිසිම දෙයක බැඳ නැති බවයි. ඊට පසුව නූල බල්ලෙකුගේ ඇඟේ බඳින ලදී. නැවත වරක් නූල අල්ලා බැලූ වෛද්‍යවරයා කීවේ එය බැඳ ඇත්තේ මනුෂ්‍යයෙකුගේ ඇඟේ නොව තිරිසනෙකුගේ ඇඟේ බවය. වෛද්‍යවරයාගේ දක්ෂකම ගැන සතුටට පත් වූ

රජතුමා අවසානයේදී රජ බිසවගේ අතේ බඳින්නට අණ කළේය. වෛද්‍යවරයා නූල ඇල්ලූ සැණින් ම පැවසුවේ රෝගියා "ඔජර" රෝගයෙන් පෙළෙන බවත් එය සුව කළ හැකි බවත් ය. කුමන ප්‍රතිකාරයකින්දැයි විමසූ විට "ළය විරේකයකින්" යැයි කීය. රජතුමාගේ අවසරය ලබා ගෙන වෛද්‍යවරයා බෙහෙත පෙව්වේය. බෙහෙත හොඳින් ක්‍රියා කළ පසු රෝගයට හේතුව රජ බිසවට කැවී ඇත්තේ කෙස් ගහක් බව ඔහු පෙන්වා දුන්නේය. රෝග ලක්ෂණ පහළ වීමට හේතුව වී ඇත්තේ එයය. වෛද්‍යවරයාගේ දක්ෂකම ගැන අතිශය ප්‍රීතියට පත් වූ රජතුමා වෛද්‍යතිලක රාජකරුණා ගෝපාල මුදලි නමැති පටබැඳි නාමය සමග බෙත්ගේ මුහන්දිරම් පදවිය ඔහුට පිරිනැමුවේය. පරණකුරු කෝරළයේ ගොඩිගමුවේ ගෙවිලිපිටිය දුම්බර ගහලගංමොඩ සහ බෝපිටිතැන්න මාතලේ ඉනිගල සහ යටිනුවර මොලදන්ඩ සහ මාලගම්මන යන නින්දගම් ද ඔහුට ප්‍රදානය කළේය.

මහනුවර රජතුමාගේ ආරාධනය පරිදි ගෝවේ සිට මෙහි පැමිණියේ යෝනකවරුන් කිහිප දෙනෙකු පමණි. එහෙත් පසුව ඔවුන්ට විවාහ වීමට උවමනා වූ විට ඔවුන් මුස්ලිම් භක්තිකයින් නිසා සිංහල රදළ පවුල් වල කාන්තාවන් ඔවුන්ට ලබා ගත නොහැකි විය. රජතුමාට කෙසේ හෝ මෙම යෝන්කවරුන් මෙහි නවත්වා ගැනීමට උවමනා වුයෙන් ඔවුන්ට

භාර්යාවන් ලබා දීමේ උපක්‍රමයක් යෙදුවේය. ආවැඩුම උත්සවයක් සඳහා තරුණ ගැහැනු ළමයින් කීප දෙනෙකු රාජ සභාවට කැඳවන ලදී. මෙයින් යෝනකවරුන්ගේ කැමැත්ත ප්‍රකාර රාජ අනුග්‍රහය ඇතිව මෙම ළමයින්ව යෝනකවරුන්ට විවාහ කර දෙන ලදී.

ගෝපාල යෝනකවරුන්ට මහනුවර පදිංචි වීමට සලස්වන ලදී. ඔවුන්ට ඔවුන්ගේ රටේ ප්‍රධානියාගේ ජාතික ඇඳුම ඇඳීමට අවසර ලැබුණේය. වෛද්‍ය විද්‍යාවේ දැනුමට අමතරව ඔවුන්ට පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුමක් ද විය. ඔවුහු අලින්ට සහ අශ්වයන්ට ද වෙදකම් කළහ. ඔවුහු කඩු හරඹයේද අති දක්ෂයෝ වූහ. ඔවුන් පවසන අන්දමට ඔවුන්ගේ මුතුන් මිත්තන්ට සංගීතය පිළිබඳ හසළ දැනුමක් තිබී ඇති අතර ඔවුන් රජුගේ කවිකාර මඩුවේ ගී ගයා සහ වීණා වාදනය කර ඇත. මහනුවර රජවරුන් යටතේ ඔවුන් මාතලේ මින්නේරිය සහ පුත්තලමේ මඩිගේ තනතුරු දරා ඇත. බෙත්ගේ මුහන්දිරම්ගේ පාලනය යටතේ රජ මාලිගාවේ වෛද්‍යවරුන් 24 දෙනෙකු සිටි බව ඔවුහු කියා සිටිති. වැදගත් නායකයෙකු අසනීප වූ විට ඔහුට ප්‍රතිකාර කිරීම සඳහා ඔවුන්ගෙන් කෙනෙකු රජතුමා විසින් වහාම යවන ලදී.

වයස්ගත ගැමියෙකුට කරන ලද වෛද්‍ය ප්‍රතිකාර සඳහා කෘතගුණ සැලකීමක් වශයෙන් ඔවුන්ගෙන් කෙනෙකුට ගැටඹේරිය ගම ප්‍රදානය කරන ලදී.

කෑගල්ල දිස්ත්‍රික්කයේ ගෝපාල යෝනකවරු එදා සිට ගැටබේරිය ගමේ දිගටම ජීවත් වුහ. තමන් "මෝගල් පටානි" නමැති ජාතියකට අයත් බව ගෝපාල යෝනකවරු පවසති. මොවුන් උතුරු ඉන්දියාවේ ඉස්ලාමිකයින් බවට සැක නැත. ගෝපාල යෝනක වරුන්ට සිංහල හා දෙමළ යන භාෂා දෙකම ලිවීම සහ කියවීම කළ හැකිය. අනෙකුත් යෝනකවරුන් මෙන්ම මොවුහු ද ඉස්ලාම් දහම අදහති. "බෙත්ගේ උඩයාර්" "බෙත්ගේ නිලමේ" වැනි පටබැඳි නම් ද උස්මාන් වැනි අරාබි නම් ද ඔවුන්ට ඇත.

දැනට ජීවත් වන වෘද්ධතම ගෝපාල යෝනකවරයා වන්නේ ගැටබේරියේ වයස අවුරුදු 70 ක් වන සේගු මදාර් උඩයාර් ය. දක්ෂ වෛද්‍යවරුන් වශයෙන් ඔවුන්ට තිබූ කීර්තිය ඔහු විසින් හොඳින් රැක ගෙන ඇත. දුර බැහැර සිට ඔහුගෙන් ප්‍රතිකාර ගැනීම සඳහා පැමිණෙන ජනයා බොහෝය. ගෝපාල යෝනකවරුන්ගේ විශේෂ ලක්ෂණයක් නම් ඔවුන් එක් ප්‍රදේශයකට සීමා වීමය. සාමාන්‍ය යෝනකවරු ලංකාවේ සැම තැනම සිටිති. එහෙත් ගෝපාල යෝනකවරු ප්‍රධාන වශයෙන් සිටින්නේ ගැටබේරිය උඩුනුවර වෙලම්බඩ සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මීරිගම්පිටිය යන ප්‍රදේශවල ය. ඔවුන්ගෙන් කීප දෙනෙකු පමණක් කොළඹ සහ අනිකුත් ප්‍රදේශ වල ජීවත් වනු ඉඳහිට දක්නට ලැබේ.

ගෝපාල යෝනකවරු මහනුවර ප්‍රදේශයේ ජීවත් වූ බවත් ඔවුන්ගෙන් ඇතැම් දෙනෙකු උසස් පදවි වලට පත් වූ බවත් ඔප්පු කෙරෙන වෙනත් සාක්ෂි ඇත. මැතක් වනතුරුම ඔවුන්ගේ අවංක විශ්වාසවන්ත සේවය සඳහා නිසි සැලකිලි ලැබී ඇත. දෙවන රාජසිංහ රජු විසින් ඔහුගේ බාල බෑනා වන විජයපාල මැරවීමට හේතු වූ කාරණා ගැන 1669 දී ලන්දේසීන් විසින් සාක්ෂි විභාග කරන ලද සාක්ෂි කරුවන්ගේ නම් අතර ගලගම අධිකාරමගේ නම ළඟටම සඳහන් වන්නේ "ගෝපාල මුදලි සහ යෝනක මොහොට්ටාල" යන නමය.

ඊට ශත වර්ෂ එකහමාරකට පමණ පසු රාජකරුණා ගෝපාල මුදියන්සේලාගේ සේගු මොහම්මඩ් උඩයාර් 1828 මාර්තු මස 20 වන දින දරණ පත්වීමේ ආඥාව මගින් බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතේ වෛද්‍යවරයෙකු වශයෙන් පත් කරන ලදී. ඒ අයුරින්ම සේගු මදාර් උඩයාර් ද 1833 ජුනි මස 8 වන දින ආඥාව යටතේ 1833 දී වෛද්‍යවරයෙකු වශයෙන් පත් කරන ලදී. දිගු කලක් සේවය කිරීමෙන් පසුව ඔහු කොටගොඩ ආරච්චි ධුරයෙන් ඉල්ලා අස්විය. මේ ප්‍රදානය ලැබූ ගෝපාල මුදලිගේ පරම්පරාවේ දැන් ජීවත් ව සිටින තැනැත්තා විසින් කියා සිටින්නේ මොලදණ්ඩ නමැති රාජද්‍රෝහියාගේ ආගන්තුක සත්කාර ලබන්නට රජතුමා පැමිණි විට දී උල් කටු සහිත බොරු වළකට රජතුමා හෙළීමට ඔහු කුමන්ත්‍රණය කළ බවයි.

යෝනක මුදලිවරයා මේ කුමන්ත්‍රණය කලින් දැනගෙන රජුට සැල කළේය. මොලදණ්ඩ අනුන්ට කැපූ වළේ තමාම වැටුණේය.

# ශ්‍රී ලංකා මුස්ලිම් වරුන්ගේ අතීත පිය සටහන්-8

## සිංහ කොඩිය අරාබියෙන් ලැබුණ තෑග්ගකි. මේ බවට මුඛ පරම්පරාගත කතා ඇත

<u>(එස්. ඊ. එන්. නිකලස් විසින් 1951 පෙබරවාරි 11 වන දින 'ටයිම්ස් ඔෆ් සිලෝන්' සන්ඩේ ඉලස්ට්‍රේටඩ් පුවත්පතට සැපයූ ලිපියක් )</u>

මේ රටේ ජාතික කොඩිය වශයෙන් සිංහ කොඩිය පිළිගැනීමේ අදහස මීට තුන් අවුරුද්දකට පමණ පෙර පළ කළ අවස්ථාවේ දී ඒ ගැන විවිධ අදහස් මතු විය. බොහෝ දේශපාලඥයෝ මෙය පිළිගැනීමට ඉතා දැඩි ලෙස උනන්දු වූහ. එසේ වීමට හේතුව සිංහ කොඩිය සිංහලයින්ගේ කොඩිය වශයෙන් ශත වර්ෂ ගණනාවක් තුළ භාවිත වූයේ යැයි ඔවුන් සිතා ගෙන සිටීමය. එහෙත් ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය පිළිබඳ ආචාර්ය වරයෙකු තීරණය කළේ ජාතික කොඩිය වශයෙන් සැලකෙන සිංහ කොඩිය ශ්‍රී **වික්‍රම රාජසිංහ නමින් ලංකාවේ අන්තිමට රජ කළ**

**කන්දසාමිගේ පාලන සමයේ දී භාවිත කළ කේරළ ධජයක් පමණක් බවය.**

ආචාර්ය අන්ද්‍රයෙස් නෙල් ද මීට සමාන අදහසක් පළ කරමින් කියා සිටියේ සිංහ කොඩිය මුස්ලිම් වරුන්ගෙන් ලැබුණු දෙයක් විය හැකි බවත් එනිසා එය සිංහලයින්ගේ ජාතික කොඩිය වශයෙන් භාවිත කළ නොහැකි බවත් ය. ජාතික කොඩිය පිළිබඳ ප්‍රශ්නය සදහටම තීරණය කිරීම පිළිබඳව ගිය අවුරුද්දේ ව්‍යාපාරයක් ඇති වූ විට තවත් නොයෙක් මත පළ කරන ලදී. ලංකාවේ රජවරු ඔවුන්ගේ රාජ පරම්පරාවේ අවසාන කොටසේදී රාජකීය ලාංඡනය වශයෙන් සිංහයා යොදා ගත්තේ ඇයි? සත්තකින්ම මලබාර් රජවරුන් මෙය යොදා ගත්තේ සිංහලයින් සිංහයෙකුගෙන් ඇති වූ බවට ප්‍රචලිත විශ්වාසය තහවුරු කොට සිංහලයින් සතුටු කිරීමට නම් නොවේ.

## ඉතිහාසයෙන් සාධක නොලැබේ

ලංකාවට සිංහ කොඩිය ලැබුණු ආකාරය සම්බන්ධයෙන් යම්කිසි අදහසක් ඇති කර ගැනීමට ඉතිහාසයෙන් තොරතුරක් ලැබේ දැයි පරීක්ෂා කිරීමට අපි ලංකා ඉතිහාසය දෙසට හැරෙමු. අනුරාධපුරයේ පුරාවස්තු අතර නෙස්ටෝරියන් (පර්සියානු

ක්‍රිස්තියානු) කුරුසයක් හමු වී ඇත. මෙයින් පෙනී යන්නේ ක්‍රිස්තු පූර්ව මුල් ශත වර්ෂ වල දී ලංකාවේ අගනුවර තුළ පර්සියානුන් පදිංචි වී සිටි බවත් ඔවුන්ට ඔවුන්ගේම දේවස්ථානයක් තිබූ බවත් ය. මෙපමණක් නොව මන්නාරමට නුදුරු මාන්තොට ලංකාවේ මුතු මැණික් කුළුබඩු ආදිය වෙළඳාම් කරන වෙළඳ මධ්‍යස්ථානයක් ද ඔවුන්ට තිබී ඇත. රාජකීය අශ්වාරෝහක හමුදාවට ඔවුන් පර්සියාවෙන් අශ්වයන් සපයා ඇත. ලංකාවේ පදිංචි වී සිටි පර්සියානු ජාතිකයින් කීප දෙනෙකුට හිරිහැර කළ සිංහලයින්ගෙන් පළිගැනීමට ඔවුන් නාවික හමුදාවක් ගෙන් වූ බවත් අපට දැන ගන්නට ලැබී ඇත.

හත් වන සියවසේදී පර්සියාව මුස්ලිම් වරුන්ගේ ග්‍රහණයට හසු වූ පසු ව ලංකාව තුළ පර්සියානුන්ගේ වෙළඳ කටයුතු නතර වී ඇත. පර්සියාව යටත් කර ගැනීමෙන් පසුව රතු සිංහ කොඩිය පර්සියාවේ ඔසවන ලදී. ඉන් පසු අරාබි ජාතිකයින් බොහෝ දෙනෙකු පර්සියාවේ පදිංචි වුහ. යුරෝපයේ දී හා ආසියාවේ දී මුස්ලිම්වරුන් නොයෙක් නම් වලින් හඳුන්වනු ලැබූහ. තුර්කිවරු මෝගල්වරු යෝනකවරු ආදී නම් ඉන් සමහරකි. ඔවුන් ලංකාවට පැමිණියේ වෙළඳාම සඳහාය. ඇතැම් මුස්ලිම් සංචාරකයින් විසින් ලංකාවේ ජනයා ගැන ද කෝට්ටේ සහ යාපනයේ එකිනෙකාට විරුද්ධ රජවරුන් දෙදෙනෙකු ගැන ද රසවත් විස්තර ලියා තබා ඇත. සිංහල රජෙකු ඉස්ලාම් දහම ගැන දැඩි

උනන්දුවක් දැක් වූ බව ද ඒ එක් සංචාරකයෙක් කියයි. ඔවුන් ලංකාව හැඳින්වුයේ 'සෙරෙන්ඩිබ්' යන නමිනි. ඔවුන් පැමිණියේ ආදම්ගේ කන්ද (සමනළ කන්ද) දැක බලා ගැනීමටය. කඳු මුදුනේ ඇති පාද ලාංඡනය ආදම්ගේ පා සටහන යැයි ඔවුහු අද දක්වා විශ්වාස කරති.

ක්‍රි. ව. 1310 දී මෝගල්වරු පාන්ඩය දේශය යටත් කර ගත් අවස්ථාවේ දී ලංකාවත් ඔවුන් යටතට පත්වී ද? එහෙත් එවැන්නක් සිදු වූ බවට අපට ඉතිහාසයෙන් කිසිදු සාක්ෂියක් නොලැබේ. එසේ නම් මුස්ලිම්වරුන්ගේ කොඩිය ලංකාවේ මලබාර් රජවරුන් අතට පත්වුයේ කෙසේද? මේ කාරණය ගැන මුඛ පරම්පරාගත කතාවක් ඇත. ලංකාවට සිංහ කොඩිය ලැබුණු කතාව කෙටියෙන් කියතොත් මෙසේය.

(පාරම්පරික මුස්ලිම් වෛද්‍යවරුන්ගේ දක්ෂතා පිළිබඳ ව පහතින් ඉදිරිපත් කරන විස්තරයට සමාන වූ සිදු වීමක් මෙම ලිපි පෙළේ මෙයට පෙර ඉදිරිපත් කළ ලිපියේද සඳහන් කොට ඇත.) මුස්ලිම්වරුන්ට අයිති ව තිබූ පර්සියාවේ වැසියන් කණ්ඩායමක් ඉන්දියාව හරහා ලංකාවට පැමිණියහ. ඔවුන් ලංකාවට ගොඩ බැස්ස විට නීති විරෝධී ව රටට ඇතුළු වූ අය වශයෙන් සලකා ඔවුන් අල්ලා සිරගෙයි ලන ලදී. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ බිසව බරපතළ ලෙස රෝගාතුර

ව සිටින බවත් රාජකීය වෛද්‍යවරුන්ට සුව කළ නොහැකි ව සිටිනා බවත් බන්ධනාගාර පාලකයින්ගෙන් මේ සිරකරුවන්ට දැන ගන්නට ලැබිණ. මේ සිරකරු කණ්ඩායම තුළ මුස්ලිම් පාරම්පරික වෛද්‍ය ක්‍රමය දන්නා සහෝදරයන් තිදෙනෙක් වූහ. රජ බිසව සුව කිරීමට ඔවුහු සිය කැමැත්තෙන් ඉදිරිපත් වූහ. රජතුමාට මෙය සැල වූ වහාම රජතුමා වහාම ඔවුන් ගෙන්වා ඔවුන්ගේ උපකාරය ලබා ගැනීමට සූදානම් විය. රජ බිසවට ප්‍රතිකාර කළ යුතු වුවත් ඇගේ අත ඇල්ලීම තහනම් බව ඔවුන්ට දන්වන ලදී. එවිට ඔවුන් කියා සිටියේ තිරයක් පිටුපස රෝගියා තබා රෝගියාගේ අතේ නූලක් බැඳ එම නූල ඔවුන්ට අල්ලා ගැනීමට දුන් විට එම නූලේ ආධාරයෙන් රෝගියාගේ නාඩි පරීක්ෂා කර රෝගය නිශ්චය කළ හැකි බවය. රජතුමා ට මෙහි ඇති සත්‍යතාව පරීක්ෂා කිරීමට උවමනා විය. එකී පරිදි නූලේ එක් කෙළවරක් ඔවුන් අතට දී පළමු ව නූලේ අනික් කෙළවර පුටු ඇන්දක බඳින ලදී. නූල පරණ ලීයක බැඳ ඇති හෙයින් රෝගය නිශ්චය කළ නොහැකි බව ඔවුහු පැවසූහ. ඊට පසුව එම නූල බළලෙකුගේ පාදයක බැඳ අනිත් කෙළවර ඔවුන්ට දෙන ලදී. ඔවුන් කියා සිටියේ නූල සිව්පාවෙකුගේ ඇඟේ බැඳ ඇති බවය. ඊට පසු නූල රෝගාතුර ව සිටි ඇමතිවරයෙකුගේ අතේ බඳින ලදී. එම ඇමති වරයාගේ රෝගය රජතුමා කලින් දැනගෙන සිටීය.

මෙවර එකී විශේෂ වෛද්‍යවරු එය නම් මනුෂ්‍යයෙකුගේ නාඩි ගැස්ම බව පවසා රෝගය ද නිවැරදි ව නිශ්චය කළහ. අවසානයේ දී නූල බිසවගේ අතේ බැඳ නාඩි බලා රෝගය හඳුනා ගන්නා ලද්දෙන් නිසි ප්‍රතිකාර කිරීමෙන් ටික දිනකින් රෝගය සුව කරන ලදී.

## රජතුමා සතුටට පත්වෙයි

මෙම දක්ෂ වෛද්‍යවරුන් ගැන රජතුමා අතිශයින් සතුට ට පත් විය. ඔවුන් ව වහාම සිරෙන් නිදහස් කරවා රාජකීය වෛද්‍යවරුන් ලෙස පත් කරන ලදී. ඔවුන්ගේ කණ්ඩායමේ අනික් පිරිස ද වහාම නිදහස් කරන ලෙසට අණ කරන ලදී. ඔවුන් රජතුමාගේ රාජධානියේ පදිංචි කරවා ඔවුන්ට මිල මුදල් ආදී නොයෙකුත් වස්තු පරිත්‍යාග කරන ලදී.

එම කණ්ඩායමේ එක් අයෙකු ආලිම්වරයෙකු (ඉස්ලාමීය විද්වතෙක්) විය. දිනක් ගමනක් යන අතරතුර දී ඔහුට පිපාසය දැනී සිංහල ගැමි තරුණියක වෙත ගොස් බීමට යමක් ඉල්ලා සිටීය. ඇය ඔහුට පානය කිරීමට කිතුල් මී රා දී ඇත. මෙය මත් වීමක් සිදු කරන්නක් බව නොදැන ඔහු මේ රසවත් පානය ඇති තරම් බී තෑග්ගක් වශයෙන් ඔහුගේ රන් මුදුව කළය තුළට දමා ඇත. තරුණියගේ පියා පසු ව නිවසට පැමිණ මී රා බොන අතර තුර දී කළය තුළ

තිබූ මුද්ද දැක ඇත. මේ ගැන දියණියගෙන් විමසූ විට ඇය කියා සිට ඇත්තේ සංචාරක පූජකයෙකු පැමිණ බීමට යමක් ඉල්ලා සිටියෙන් ඇය ඔහුට කිතුල් රා කළය දුන් බවත් ඔහු මුද්ද කළය තුළට දමා යන්නට ඇති බවත් ය. පියා නැති අතරතුර දී දියණිය අමුත්තෙකුට සංග්‍රහ කර ඇති බව ඇසූ පියාගේ කෝපය ඉහ වහා ගියේය. ඔහු ඇයට තදින් දොස් කියා දඬුවම් කළේය.

ගෙහිමියා නැති විටෙක ගෙදර තරුණියකගෙන් විදේශිකයෙකු බීමක් ලබා ගැනීමෙන් සිදු වූ නින්දාව ගැන ගම් වැසියෝ ද නොසන්සුන්තාවකට පත් වූහ. එහෙත් රජතුමාට මෙය ආරංචි වූ විට රජතුමා තරුණිය මාලිගාවට ගෙන්වා ඇයව එම තැනැත්තාට විවාහ කර දී ඇයට අවශ්‍ය සියලු දෑ ද සපයා දුනි. වෙද්‍යවරුන් සමග පැමිණි කණ්ඩායම මේ සිද්ධියෙන් පසු ක්‍රමක්‍රමයෙන් අපකීර්තියට පත් වන්නට පටන් ගත්හ. එනිසා ඔවුහු ආපසු සියරට ට යන්නට තීරණය කළහ. එහෙත් රජතුමා ඊට අකමැති විය. රජතුමා ඔවුන්ට කීවේ ආලිම්වරයා මෙන් ලංකාවේ පදිංචි වන ලෙසය. එහෙත් මේ විදේශිකයින් ඔවුන්ගේ රටවල උසස් පවුල් වල අය වූ හෙයින් ගම්වැසි තරුණියන් විවාහ කර ගැනීමට අකමැති වූහ. එවිට රජතුමා ඔවුන්ට ගැළපෙන පරිදි උසස් පවුල්වල කාන්තාවන් හඳුන්වා දීමට පොරොන්දු විය. මේ අනුව පෙරහැරක් පවත්වා මේ සිව්දෙනාට තමන් කැමති තරුණියන් තෝරා

ගැනීමේ අවස්ථාව සලසා දෙන ලදී. ඔවුහු මෙලෙස තමන් ට සුදුසු යැයි හඳුනා ගත් තරුණියන් සමග විවාහ වී මෙහි පදිංචි වූහ. රජතුමා විසින් ඔවුන්ට තෑගි බෝග ද අවශ්‍ය අනෙකුත් සියලු දේ ද සපයා දෙන ලදී.

රජතුමාගේ කාරුණිකත්වයට කෘතගුණ සැලකීමක් වශයෙන් ඔවුන් විසින් ඔවුන්ගේ රටේ ධජය රජතුමාට පරිත්‍යාග කරන ලදී. ඔවුන් පැවසුවේ මේ කොඩිය සතුරන් ඉදිරියේ රජතුමාට කීර්තියක් හා අභිමානයක් ගෙන දීමට තරම් තේජසක් ඇති ධජයක් බවය. ඉන් පසු එම කොඩියෙන් මෝගල් ලාංඡනය ඉවත් කොට එකල අවදානම් වැඩක් වූ අය බදු එකතු කිරීමට රාජ පුරුෂයන් යන විට මෙම මුස්ලිම් සිංහ කොඩිය රැගෙන යන ලදී. සිංහ කොඩිය ලංකාවට පැමිණීම ගැන ඇති පරම්පරාගත කතාව මෙයයි. මෙය සිංහල විද්වතුන් කීප දෙනෙකු විසින් ම අනුමත කර ඇති විස්තරයකි. එම පිරිසේ සිටි ගණන හා රජතුමාගේ නම සම්බන්ධයෙන් සමහර මතභේද ඇත. සමහරුන් පවසන අන්දමට මේ පිරිසේ සිට ඇත්තේ පස් දෙනෙකු (ආලිම්වරයා ඇතුළු ව) නොව හත් දෙනෙකි. රජු ද ක්‍රි. ව. 1747 පමණ රජකම් කළ කීර්ති ශ්‍රී රාජසිංහ නොව 1464 පමණ කාලයේ දී රජකම් කළ දෙවන බුවනෙබබාහු රජු බව ඇතැම් අයගේ මතයයි.

'විවිධ වාර්ගිකයින්' සැලකිල්ලට ගෙන ජාතික කොඩියක් සකස් කර ගැනීමේ කටයුත්ත දැන් අවසානය. එය ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය ලෙස පිළිගැනීම සඳහා ළඟදීම පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා බව කියැවේ. මේ කොඩියේ මැද සිංහයා නම් සිටිය යුතුමය. සිංහයාගේ අතේ වර්තමාන ජාතික කොඩියේ පෙන්නුම් කරන භයානක ආයුධය වෙනුවට දැල්වෙන පහනක් තිබිය යුතු අතර සිංහයා බෞද්ධ හින්දු කිතුනු මුස්ලිම් යන දහම් හතරේම වැදගත් ස්ථානයක් වශයෙන් සැලකෙන සමනල කන්ද දෙස බලා සිටින අයුරු සකස් කළ යුතු යැයි අපි සිතන්නෙමු.